# 2013

## කාර්ය සාධන හා ගිණුම් වාර්තාව

## வருடாந்த நிருவாக மற்றும் நிதி அறிக்கை

## Annual Performance & Accounts Reports



**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර**

மாவட்ட செயலகம் - கண்டி

**District Secretariat - Kandy**

# කාර්ය සාධන හා ගිණුම් වාර්තාව - 2013

# வருடாந்த நிருவாக மற்றும் நிதி அறிக்கை - 2013

# Annual Performance Report & Accounts -2013



## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර

## மாவட்ட செயலகம் - கண்டி

## District Secretariat - Kandy

## පෙළගැස්ම


පිටු අංකය

1. දිස්ත්‍රික් ලේකම්ගේ පණිවිඩය 1

2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ හැදින්වීම 2
   - 2.1 දැක්ම,අගයන් හා මෙහෙවර 3
   - 2.2 තත්ත්ව ප්‍රතිපත්තිය 4
   - 2.3 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන් 5-6

3. මහනුවර දිස්ත්‍රික්කය හැදින්වීම 7-10
   - 3.1 පරිපාලන සිතියම 11
   - 3.2 මූලික තොරතුරු 12

4. සංවිධාන ව්‍යුහය 13
   - 4.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය 14
   - 4.2 අංශ අනුව කාර්ය මණ්ඩලය 15-17

5. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධනය
   - 5.1 සාමාන්‍ය පරිපාලනය
     - 5.1.1 ආයතන අංශ කටයුතු 18-20
     - 5.1.2 දිස්ත්‍රික් මාධ්‍ය ඒකකයේ කටයුතු 21
     - 5.1.3 අභ්‍යන්තර විගණන කටයුතු 22-23
     - 5.1.4 දිස්ත්‍රික් විගණන හා කළමනාකරණ කමිටු කටයුතු 23-24
     - 5.1.5 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කටයුතු 25-26
     - 5.1.6 පුහුණු හා මානව සම්පත් සංවර්ධන කටයුතු
       - 5.1.6.1 පුහුණු වැඩසටහන 27-28
       - 5.1.6.2 මානව සම්පත් හා වෘත්තීය මාර්ගෝපදේශන කටයුතු 29
       - 5.1.6.3 ඵලදායිතා වැඩසටහන 30-31

6. ව්‍යවස්ථාපිත කටයුතු හා අනෙකුත් රාජකාරි
   - 6.1 පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු ඒකකයේ කටයුතු 32
   - 6.2 මෝටර් රථ ප්‍රවාහන කටයුතු 33-34
   - 6.3 පුපුරණ ද්‍රව්‍ය අංශයේ කටයුතු 34
   - 6.4 පාරිභෝගික සේවා අධිකාරියේ කටයුතු 35
   - 6.5 මිනුම් ඒකක ප්‍රමිති හා සේවා කටයුතු 36
   - 6.6 පරිසර කටයුතු 36-37
   - 6.7 සංඛ්‍යා ලේඛන කටයුතු 37-38

7. සමාජ සේවා හා සංස්කෘතික

7.1 සංස්කෘතික කටයුතු 38-39
7.2 බෞද්ධ කටයුතු 39-40
7.3 සමාජ සේවා කටයුතු 40-41
7.4 සමාජ ආරක්‍ෂණ කටයුතු 41-42
7.5 ළමා ආරක්‍ෂක කටයුතු 42
7.6 මුල් ළමාවිය සංවර්ධන කටයුතු 43
7.7 ළමා හිමිකම් ප්‍රවර්ධන කටයුතු 43-44
7.8 දිස්ත්‍රික් වනිතා කටයුතු 45
7.9 ජාතික ඒකාබද්ධතා කටයුතු 46
7.10 කුඩා ව්‍යාපාර සංවර්ධන කටයුතු 46-47
7.11 දිස්ත්‍රික් ක්‍රීඩා සංවර්ධන කටයුතු 47-48

8. සංවර්ධන කටයුතු

8.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉදිකිරීම් කටයුතු 49-53
8.2 දිස්ත්‍රික් ආයෝජන වැඩසටහන 54-56
8.3 දිස්ත්‍රික් සමෘද්ධි සංවර්ධන කටයුතු 57
8.4 කෘෂිකර්ම කටයුතු 58
8.5 දිස්ත්‍රික් ඉඩම් පරිහරණ හා සැලසුම් කටයුතු 59
8.6 රේඛීය අමාත්‍යාංශ සහ අනෙකුත් දෙපාර්තමේන්තු ගෙවීම් විස්තර 60

10. දෙමළ පරිවර්තනය 61-139

11. ඉංග්‍රීසි පරිවර්තනය 140-209

12. ගිණුම් වාර්තාව 210-235



## මනා පරිපාලන හා සංවර්ධන ක්‍රමෝපායන් තුලින් ජනහිතකාමී තිරසර සංවර්ධනයක් කරා ...

ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ වැඩ සිටින කන්ද උඩරට මහනුවර, ලෝක උරුම නගරයක් ලෙස ලෝකවාසී බෞද්ධ ජනතාවගේ මහත් වූ ගෞරවාදරයට පාත්‍රව ඇත. මහනුවර දිස්ත්‍රික්කය ස්වභාව සෞන්දර්යයෙන් මෙන්ම සෞම්‍ය වූ දේශගුණයකින් පොහොසත් වූ සුවිශේෂී දිස්ත්‍රික්කයකි.

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 2013 වර්ෂය තුලද අභ්‍යන්තර පරිපාලන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම උදෙසා විවිධ උපාය මාර්ග ක්‍රියාත්මක කරමින්, ජනතා සිතුම් පැතුම් වලට වඩාත් සමීප දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනයක් ස්ථාපිත කිරීම තුලින් පරිසර හිතකාමී තිරසාර සංවර්ධනයක් කරා යොමු විය.

පෙරහැර භාරයේ කටයුතු, සංස්කෘතික, සමාජ සේවා, සමාජ ආරක්‍ෂණ, ආපදා කළමනාකරණ, පාරිභෝගික ආරක්‍ෂණ, කිරුම් මිණුම්, මැතිවරණ, පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර කටයුතු , දිස්ත්‍රික් සම්බන්ධීකරණ හා දිස්ත්‍රික් සංවර්ධන ආදී සියලු කමිටු කැඳවීම් හා මෙහෙයවීම් වැනි ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන සියලු කටයුතු පසුගිය වසර තුලදී සාර්ථකව ඉටු කරනු ලැබීය.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල කාර්යාල පරිසරයන් හා භෞතික පහසුකම් වැඩිදියුණු කිරීම තුලින් සංවර්ධනාත්මක ආකල්ප වලින් හෙබි කාර්ය මණ්ඩලයක් ස්ථාපිත කිරීමට කටයුතු යෙදීය.

දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ හා අවට අනවශ්‍ය දෑ ඉවත්කර පිරිසිදු කිරීම හා අලංකාරවත්, ප්‍රියමනාපවත් පරිසරයක් පවත්වාගෙන යාමට නිසි වැඩපිළිවෙලක් හා ක්‍රමවේදයන් ක්‍රියාත්මක කරනු ලැබීය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ලේ වහළය අළුත්වැඩියා කිරීම, සංවර්ධන අංශය, අභ්‍යන්තර විගණන අංශය හා මෙහෙයුම් මැදිරිය අළුත්වැඩියා කිරීම, වැසිකිළි පද්ධතිය, ජලනල පද්ධතිය නවීකරණය කිරීම, පළමු මහලේ කොරිඩෝව හා පඩිපෙළ පිහන් ගඩොල් ඇතිරීම, අභ්‍යන්තර දුරකථන පද්ධතිය නැවත ස්ථාපිත කිරීම ඇතුළු නඩත්තු සඳහා රු. මිලියන 17.2 ක් පසුගිය වසරේදී වැය කර ඇත. පළමු මහලේ මින් මැදුරක්ද ස්ථාපිත කිරීම ගොඩනැගිලි පරිශ්‍රය අලංකරණයට තවත් හේතුවක් විය. එසේම වර්ග මීටර් 2750 ක ප්‍රමාණයකින් යුත් නවීන පහසුකම් සහිත ආසන 825 කින් සමන්විත දෙමහල් ශ්‍රවණාගාරයක් ද ඉදිකිරීමේ කටයුතු 2013 වසරේදී ආරම්භ කිරීම සුවිශේෂී තත්ත්වයකි. මේ සඳහා වෙන් වූ ප්‍රතිපාදන මුදල රු.මි. 200 ක් වන අතර වසර 3 ක් ඇතුළත ඉදිකිරීම් නිම කිරීමට නියමිතය.

2013 වර්ෂයේදී 2012 වර්ෂයට සාපේක්‍ෂව තවදුරටත් වැඩිදියුණු කරගත් කාර්ය සාධන මට්ටමක් කරා ළඟාවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට මෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් වලටද හැකිවීම සතුටට කරුණකි. එයට සමගාමීව ඵලදායිතා ලේකම් කාර්යාලය මඟින් පැවැත් වූ ඵලදායිතා තරඟයෙන් 2010/ 2011 ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර ජාතික මට්ටමේ තරඟයෙන් මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ප්‍රථම ස්ථානය හිමි වීමද දිස්ත්‍රික් ලේකම් කාර්යාල අතරින් මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ප්‍රථම ස්ථානය දිනා ගැනීමත් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 න් 17ක් තරඟය සඳහා ඉදිරිපත් වූ අතර ඉන් 16ක් ජයග්‍රහණයන් ලබා ගැනීමට සමත් වීම සුවිශේෂ තත්ත්වයක් මෙන්ම යහපත් කාර්යසාධන මට්ටමක් දිස්ත්‍රික් පරිපාලනය තුල තිබූ බවට හොඳ සාක්‍ෂියකි. හාරිස්පත්තුව හා පාතදුම්බර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් ස්වර්ණ සම්මාන සඳහා අයදුම් කර ඇත.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය එකම කණ්ඩායමක් ලෙස කටයුතු කරමින් පැහැදිළි දර්ශනයක් යටතේ ක්‍රියාත්මක සැලැස්මක් තුළ ඵලදායිතා කව ක්‍රියාත්මක කිරීම තුලින් නිරන්තර ප්‍රගතිය පරික්ෂා කරමින් මෙම මට්ටම පවත්වා ගැනීමට හැකි විය .මෙම කාර්ය සාධන මට්ටම පවත්වා ගැනීම සඳහා සමස්ත කාර්ය මණ්ඩලයම ඒකාබද්ධව කටයුතු කරනු ලැබීමෙන් මෙම ප්‍රතිඵල අත් කර ගැනීමට හැකි වූ බව මම විශ්වාස කරන අතර ඒ සඳහා සමස්ත කාර්ය මණ්ඩලය කැප කිරීම් කරමින් කරන ලද සේවාව ඉතා අගේ කොට සලකමු.

එච්.එම්. ගාමිණී සෙනෙවිරත්න
මහනුවර දිස්ත්‍රික් ලේකම්/ දිසාපති

2014 අප්‍රේල් මස 10 වැනි දින මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## 2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ හැඳින්වීම

මධ්‍යම පළාතේ ප්‍රධානතම දිස්ත්‍රික්කය වන මහනුවර දිස්ත්‍රික්කය උතුරට මාතලේ දිස්ත්‍රික්කයෙන් ද නැගෙනහිරට බදුල්ල දිස්ත්‍රික්කයෙන් ද දකුණට නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් ද බස්නාහිරට කෑගල්ල දිස්ත්‍රික්කයෙන්ද මායිම්ව පිහිටා ඇත. දිස්ත්‍රික්කයට සම්පතක් වී ඇති සමනළ අඩවියේ උපන් මහවැලි නදිය පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඔස්සේ ගඟඉහළ කෝරළේ, උඩපළාත, දොළුව, උඩුනුවර, යටිනුවර, හාරිස්පත්තුව, ගඟවට කෝරළේ, කුණ්ඩසාලේ හා මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හරහා ගලා බැස පසුව දිස්ත්‍රික්ක මායිමෙන් ගලා ගොස් මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හරහා බදුල්ල දිස්ත්‍රික්කයට වැටේ.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20ක් ද ප්‍රාදේශීය සභා 17ක් ද ග්‍රාම නිලධාරි කොට්ඨාස 1188 කින් ද සමන්විත වන මහනුවර දිස්ත්‍රික්කයේ ජනගහනය 2011 ජන හා නිවාස සංගණනය අනුව 1,369,899ක් වේ . මුළු ජනගහනයෙන් 74.34% ක් සිංහල ද, 11.31%ක් ද්‍රවිඩ ද, 13.95%ක් මුස්ලිම් ද, 0.40% ක් වෙනත් ජාතීන්ගෙන් ද සංයුක්ත වේ. කන්ද උඩරට ජනතාව ආගන්තුක සත්කාරයට මහත් රුචිකත්වයක් දක්වන උත්තුංග මානුෂික ගුණාංග වලින් හෙබි සුවිශේෂී ජන පිරිසක් වන අතර ඒ බව සමාජ විද්‍යාඥයින් විසින් ද පිළිගෙන ඇත.

විවිධ විදේශීය ආක්‍රමණවලට ලක්වූව ද ස්වාධිනව පැවති කන්ද උඩරට 1815 මාර්තු දෙවෙනිදා අත්සන් කළ උඩරට ගිවිසුමත් සමග ස්වෛරී බව අහෝසි වූ බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත්විය. ඒ සමගම කන්ද උඩරට පැවැති රජු මුල්කොටගත් දේශිය රාජ්‍ය පරිපාලන ව්‍යුහය මුළුමනින්ම බිඳ වැටුණි. ඒ අනුව බ්‍රිතාන්‍ය යුගයේ මධ්‍යම පළාතේම ප්‍රධාන පරිපාලන නිලධාරියා මහනුවර කච්චේරියේ දිසාපතිවරයා විය. ඉතිහාසගත තොරතුරු මූලාශ්‍රවලට අනුව මහනුවර කච්චේරිය ක්‍රි.ව. 1825 දී මහනුවර රජගෙදර කේන්ද්‍ර කොටගෙන ආරම්භ කොට ඇත. මහනුවර ප්‍රථම දිසාපතිවරයා ලෙස සුදු ජාතික ජෝර්ජ් ටර්නර් මහතා 1825 සිට 1837 දක්වා කාලය තුළ කටයුතු කොට ඇත.

මහනුවර රජගෙදර කේන්ද්‍රකොටගෙන පවත්වාගෙන යනු ලැබූ මහනුවර කච්චේරිය 1868 දී ශ්‍රී දළදා මාළිගාවේ පත්තිරිප්පුව වෙත රැගෙන ගොස් ඇති බවටද, තොරතුරු හමුවෙයි. එවකට මහනුවර සමයේ දිසාපතිවරයා ලෙස කටයුතු කොට ඇත්තේ සුදු ජාතිකයෙකු වූ පී.ඩබ්.බේබුක් මහතාය.

මීට අමතරව විවිධ හේතූන් මත මහනුවර කච්චේරිය මහනුවර තැපැල් කාර්යාල ගොඩනැගිල්ලට තාවකාලිකව ගෙන ගොස් ඇත. පසුව 1880 දී ශ්‍රී දළදා මාළිගාවට සමීපව ඉදිකළ ගොඩනැගිල්ලට (පසු කාලීනව උසාවි ගොඩනැගිල්ල) ගෙන ගොස් ඇති අතර එවකට දිසාපතිවරයා ලෙස කටයුතු කොට ඇත්තේ සුදු ජාතිකයෙකු වූ එෆ්.බී. ටෙම්ප්ලර් මහතාය. එවක් පටන් අවුරුදු 80ක් පමණ රාජකාරි කටයුතු අඛණ්ඩව සිදුවී ඇත්තේ එම ස්ථානයේය.

1957 වර්ෂයේ දී මහනුවර කච්චේරිය දැනට යටිනුවර වීදියේ පවත්නා ගොඩනැගිල්ලට ගෙන ගොස් ඇති අතර එවකට දිසාපතිවරයා ලෙස කටයුතු කර ඇත්තේ ඒ.බී.එස්.එන්.පුල්ලෙයාර් මහතා වේ. 1946 වර්ෂයේ සිට දේශීය සිවිල් නිලධාරින් දිසාපතිවරුන් වශයෙන් පත් කර ඇති අතර විවිධ රාජ්‍ය ආයතන ගණනාවක කටයුතු කර ඇති ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් වන එච්.එම්.ගාමිණී සෙනෙවිරත්න මහතා වර්තමාන දිසාපතිවරයා ලෙස 2010 වර්ෂයේ සිට මේ දක්වා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඊට අනුබද්ධ අංශ 26 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ ස්ථාපිත කර ඇති අතර ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයද, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව හා මැතිවරණ දෙපාර්තමේන්තුවද මෙම ගොඩනැගිල්ල තුළම පිහිටා ඇත.

## 2.1 දැක්ම , අගයන් හා මෙහෙවර



# තත්ත්ව ප්‍රතිපත්තිය

**"ISO 9001; 2008 ජාත්‍යන්තර සේවා ප්‍රමිතීන් අනුව අඛණ්ඩව වැඩි දියුණු වන යහපාලිත කළමනාකරණ පද්ධතියක් තුලින් සේවාලාභීන් වෙත උපරිම පාරිභෝගික තෘප්තියක් අත්කරදීම"**

## 2.3 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධීකරණය, අධීක්ෂණය හා එම නිලධාරින්ගේ ආයතන කටයුතු (නිලධාරින්ගේ සේවය ස්ථිර කිරීම්, කඩඉම් පරික්ෂණ පැවැත්වීම, උසස් වීම්/සේවය දීර්ඝ කිරීම් හා නිලධාරින්ට වැටුප් ණය අත්තිකාරම් ලබා දීම් වැනි ආයතනික පහසුකම් සැලසීම)

- දිස්ත්‍රික්කය තුළ පිහිටුවා ඇති වසම් 1188 ක ග්‍රාම නිලධාරින්ට අදාල වූ ආයතන රාජකාරි ඉටු කිරීමෙන් ඔවුන් තුළ යහපත් මානසික තෘප්තියක් ඇති කිරීම.

- ශ්‍රී දළදා මාළිගාව ප්‍රමුඛ මල්වතු අස්ගිරි මහා විහාර සහ අනෙකුත් බෞද්ධ විහාරස්ථාන කටයුතු, ශ්‍රී දළදා පෙරහැර සංවිධාන කටයුතු, දිස්ත්‍රික් ශාසනාරක්ෂක බල මණ්ඩලයේ කටයුතු ඇතුළු බෞද්ධ ආගමික කටයුතු

- හින්දු මුස්ලිම් හා අනෙකුත් ආගම් වලට අදාල කටයුතු

- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව, දිස්ත්‍රික් පාරිසරික නීති ක්‍රියාත්මක කිරීම කමිටුව, දිස්ත්‍රික් ආරක්ෂක/ආපදා කළමනාකරණ කමිටුව, යනාදී කමිටු පැවැත්වීමෙන් හා දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන සියළු රැස්වීම් පැවැත්වීමට සහාය වීමෙන් අනෙකුත් රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම.

- ආර්ථික සංවර්ධන කටයුතු සහ ජලය, විදුලිය, ඇතුළු යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සමඟ දිස්ත්‍රික් ආයෝජන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

- විවධ රාජ්‍ය උත්සව සංවිධානය කර සාර්ථකව පැවැත්වීම.

- මැතිවරණ දෙපාර්තුමේන්තුව හා සම්බන්ධීකරණය කරමින් දිස්ත්‍රික්කයේ මැතිවරණ කටයුතු මෙහෙය වීම.

- නවක රාජ්‍ය නිලධාරින් පුහුණු කිරීම හා දැනට සේවයේ නිරත රාජ්‍ය නිලධාරින්ගේ හැකියාවන් හා කුසලතා වර්ධනය කිරීම උදෙසා කාලීන අවශ්‍යතා මත පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම හා පැවැත්වීම.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල යහපත් මූල්‍ය පාලනයක් ඇති කිරීම සඳහා අභ්‍යන්තර විගණන කාර්යය මණ්ඩලය මඟින් පරීක්ෂා කිරීම තුලින් මඟ පෙන්වීම.

- ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළනැංවීම සඳහා විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්පත් සම්බන්ධීකරණය කිරීම හා ක්‍රමසම්පාදන කටයුතු ඉටු කිරීම

- දිස්ත්රික් සමෘද්ධි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අධීක්‍ෂණයේ පවතින කුඩා ව්‍යාපාර, පාරිභෝගික අධිකාරිය, මිනුම් හා ප්‍රමිති ඒකක අංශය සමාජ ආරක්‍ෂණ අංශය, දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය, සංඛ්‍යා ලේඛන අංශය, මෝටර් රථ ප්‍රවාහන, සංස්කෘතික හා බෞද්ධ කටයුතු, ආපදා කළමනාකරණ කටයුතු, දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය, ජාතික ජලජීවී වගා සංවර්ධන , මැතිවරණ දෙපාර්තුමේන්තුව යන කාර්යාල සම්බන්ධීකරණ කටයුතු සහ අධීක්‍ෂණය.

- මහජනයාගෙන් ලැබෙන පැමිණිලි, පෙත්සම්, දුක් ගැනවිලි, ඉල්ලීම් යනාදිය සම්බන්ධව අදාළ අංශ වෙතින් තොරතුරු ලබා ගෙන විසඳුම් ලබාදීම හා දිස්ත්‍රික් පරිපාලනයට හා ප්‍රාදේශීය පරිපාලනයට අදාල නිලධාරින් සම්බන්ධව ලැබෙන පෙත්සම්, පැමිණිලි සම්බන්ධව අපක්ෂපාතී පරීක්ෂණ පැවැත්වීම තුලින් යහපත් පාලනයක් ඇති කිරීම.

- මහනුවර දිස්ත්‍රික්කය තුළ කොස්, දෙල් ගස් හෙළීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම අනුමත කිරීම.

- මහනුවර දිස්ත්‍රික්කය තුළ ගිනිඅවි බලපත්‍ර නිකුත් කිරීම, වාර්ෂිකව පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර ලබා දීම හා ආරක්ෂක සේවා සපයන ආයතන ලියාපදිංචි කිරීම.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය පරිශ්‍රයේ කාර්යාල සඳහා ජල විදුලි හා අභ්‍යන්තර දුරකථන පහසුකම් සැලසීම තුලින් මහජන සේවා සැපයීමට යටිතල පහසුකම් සැලසීම.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් අධීක්ෂණය වන කාර්යාලවල ආයතන කටයුතු ඉටු කිරීම.

# 3. මහනුවර දිස්ත්‍රික්කය හැඳින්වීම

මනහර කඳුවැටි හා නිම්න භූමි වලින් සැදුම්ලත් මහනුවර දිස්ත්‍රික්කය මධ්‍යම කඳුකරයේ වර්ග කිලෝමීටර් 1,940 ක භූමි ප්‍රමාණයක් වසා පැතිරී ඇති මනරම් භූමි භාගයකි.

උතුරින් මාතලේ දිස්ත්‍රික්කයේ උකුවෙල, රත්තොට ලග්ගල-පල්ලේගම හා විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලින් ද, නැගෙනහිරින් බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගනය ප්‍රා.ලේ කොට්ඨාසයෙන් ද, දකුණින් බදුල්ල දිස්ත්‍රික්කයේ කන්දකැටිය හා නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ, හඟුරන්කෙත, කොත්මලේ, නුවරඑළිය හා අඹගමුව කෝරළේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ගෙන් ද, බටහිරින් කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක, බුලත්කොහුපිටිය, මාවනැල්ල හා රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ගෙන් ද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම හා රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ගෙන් මායිම් වී පවතින මහනුවර දිස්ත්‍රික්කය, උතුරු අක්ෂාංශ 60.56 ත් 70.29 හා නැගෙනහිර දේශාංශ 80.25 ත් 80.0 අතර පිහිටා ඇත.

මහවැලි ගංඟාවට දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශ වලින් ගලා එන ජල ධාරාවන්ගෙන් වැඩි ප්‍රමාණයක් එක් වේ. මීට අමතරව දැදුරු ඔයේ ආරම්භක ජල ධාරා ආරම්භවන්නේ ද පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි. දිස්ත්‍රික්කයේ යටිනුවර හා උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල බටහිර බෑවුමෙන් ගලා යන ජලධාරා මා ඔයට එක් වී එහි ජල ධාරාව වැඩි කරයි.

මධ්‍යම පළාතේ දිස්ත්‍රික්කයන් වන මහනුවර මාතලේ නුවරඑළිය යන දිස්ත්‍රික්කයන් තුනෙන් ප්‍රධාන දිස්ත්‍රික්කය වන මෙහි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 ක් ද ප්‍රාදේශීය සභා 17ක් ද ග්‍රාම නිලධාරි කොට්ඨාස 1188කින් ද සමන්විත වන්නේය. 2011 ජන හා නිවාස සංගණනය අනුව මහනුවර දිස්ත්‍රික් ජනගහනය 1,369,899ක් වේ .එයින් 74.34% ක් සිංහලද, 11.31%ක් ද්‍රවිඩ ද, 13.95%ක් මුස්ලිම් ද, 0.40% ක් වෙනත් ජාතීන් ද වේ. සාමාන්‍යයෙන් කන්ද උඩරට ජනතාවගේ විශේෂ සමාජයීය ගති ලක්ෂණයක් ලෙස ආගන්තුක සත්කාරයට රුචිකත්වයක් දක්වන පිරිසක් වෙසෙන බව සමාජ විද්‍යාඥයින්ගේ මතයක් වේ.

**ඓතිහාසික පසුබිම**

අභිමානවත් ඉතිහාසයකට උරුමකම් කියන මහනුවර, අනුරාධපුර, පොළොන්නරු යුගයන් වලදී මලය රට ප්‍රදේශයට අයත්ව තිබූ අතර ගම්පොළ රජ කළ තුන්වන වික්‍රමබාහු රජ දවස නගරයක් වශයෙන් දියුණු කළ බව ජනප්‍රවාදයේ දැක්වේ. සෙංකඩගල නුවර නමින් එදා හැඳින් වූ මහනුවර පළමු වන විමලධර්මසූරිය රජතුමා විසින් සිංහල රාජධානියේ අග නගරය ලෙස යොදා ගනිමින් අලංකාර දළදා මන්දිරයක්, රජ මාළිගයක් ඇතුළු සියලුම අංග වලින් සම්පූර්ණ නගරයක් බවට පත් කරන ලදි. එතැන් සිට සියවස් තුනක පමණ කාලයක් පෘතුගීසි, ලන්දේසි සහ ඉංග්‍රීසි යන බටහිර බලවත් ජාතීන්ගේ නිර්මල බුදු දහම හා සිංහල සංස්කෘතිය ආරක්ෂාකර ගනිමින් 1815 මාර්තු 02 වන දින දක්වා සිංහල රාජධානියේ අගනුවර වශයෙන් සෙංකඩගල පුරවරය නොසැලී පැවතුනි. මුහුදු බඩ පළාත් බටහිර ජාතීන් පාලනය කළ යුගයේ දී ඔවුන් විසින් මහනුවර රාජධානියට වරින් වර එල්ල කෙරුන ආක්‍රමණයන්ට එරෙහිව සිදු වූ ජයග්‍රාහී සටන් බොහෝමයක් මහනුවර ආශ්‍රිතව සිදු විය. දෙවන රාජසිංහ රජ සමයේ පේරාදෙණිය, ගන්නොරුවේ දී සහ යටිනුවර දන්තුරේ දී සිදු වූ සටන් වලින් ආක්‍රමණික විදේශ හමුදා සම්පූර්ණයෙන්ම විනාශයට පත් විය. විදේශිකයන්ගෙන් සිංහල රාජධානිය රැක ගැනීමට පිහිට වූ ප්‍රධාන බල කොටුවක් වන බලන කොටුව වර්තමාන කඩුගන්නාව නගරය ආසන්නයේ පිහිටා ඇත.

1815 දී විවිධ දේශපාලන අර්බුද නිසා මහනුවර රාජධානිය බ්‍රිතාන්‍ය ජාතිකයන්ට අයත් වූ පසු අවසන් සිංහල රජ වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු එම වසරේ පෙබරවාරි 15 වන දින මැද මහනුවර බෝමුරේ ගම්මානයේ දී ඉංග්‍රීසීන් විසින් අල්ලා ගන්නා ලදි. 1815 මාර්තු 02 වන දින මහනුවර මඟුල් මඩුවේ දී

අත්සන් තැබුණු උඩරට ගිවිසුම මගින් ශ්‍රී ලංකාවේ පාලනය ඉංග්‍රීසීන් අතට පත් වූ අතර ඔවුන් විසින් රටේ අග නගරය ලෙස කොළඹ භාවිතා කරන තෙක්ම රටේ ප්‍රධාන නගරය ලෙස සැලකුනේ මහනුවරයි.

සිංහල ඉතිහාසයේ අවසන් නිදහස් සටන වන 1818 දී ඌව - වෙල්ලස්ස කැරැල්ල වෙනුවෙන් මහනුවර ප්‍රදේශයේ රදළ නායකයින් විශාල පිරිසක් නායකත්වය දී ඇත. සිය තනතුරු පසෙකලා නිදහස් සටන වෙනුවෙන් කැපවුනු මොණරවිල කැප්පෙටිපොළ, මඩුගල්ල ආදී නායකයන් බොහෝ දෙනෙකුගේ නිජ බිම වී ඇත්තේ මහනුවර ප්‍රදේශයයි. 1818 නිදහස් අරගලය කෲර ලෙස මැඩපැවැත් වූ ඉංග්‍රීසීන් විසින් මහනුවර ප්‍රදේශය ඇතුළු කඳුකරය වැවිලි කර්මාන්තය හා වෙළඳාම මත පදනම් වුණු ආර්ථික රටාවක් කරා ගෙන යන ලදි.

වැවිලි ආර්ථිකය යටතේ මුලින්ම හඳුන්වා දුන් කෝපි වගාව දිලීර රෝගයක් නිසා විනාශ වූ පසු දිවයිනේ සිටුවන ලද පළමු තේ ගස දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ලූලුකඳුර වතු යායේ අදත් දක්නට ඇත.

**ඓතිහාසික ස්ථාන**

මුළු මහත් ලෝකයේම බෞද්ධ ජනතාවගේ මුදුන් මල්කඩ වූ ශ්‍රී දළදා මාළිගාව මහනුවර නගරයේ පිහිටා ඇති අතර ඓතිහාසික වශයෙන් වැදගත් වූ සිද්ධස්ථාන විශල ප්‍රමාණයක් මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.

1. ගඩලාදෙණිය විහාරය
2. ඇම්බැක්ක දේවාලය
3. දෙගල්දොරුව රජමහා විහාරය
4. ගල්මඩුව රජමහා විහාරය
5. තලාව රජ මහා විහාරය
6. මැද මහනුවර බෝමුරේ ගම්මානය හා රජගල කන්ද ඒ අතර වේ.

**දේශගුණික හා පාරිසරික ලක්‍ෂණ**

ප්‍රධාන වශයෙන් මුහුදු මට්ටමේ සිට මීටර් 100 -1600 ත් අතර උසකින් යුත් මධ්‍යම කඳුකරයේ පිහිටා ඇති මහනුවර දිස්ත්‍රික්කයේ නැගෙනහිර ප්‍රදේශය මහවැලි ගඟට මායිම්ව මුහුදු මට්ටමේ සිට මීටර් 100 ක පමණ උසින් යුතු තැනිතලා ස්වාභාවයක් ගනී. සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මි.මී. 1840 අගයක් ගන්නා අතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර ප්‍රදේශය වන මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කඳුකර හා පහත රට වියළි කලාපීය දේශගුණික ලක්‍ෂණයන් සහිතය. සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 20-22 අතර අගයක් ගන්නා අතර වසර පුරාම සෞම්‍ය දේශගුණයක් දිස්ත්‍රික්කයේ වැඩි භූමි ප්‍රදේශයක පවතී. සාමාන්‍යයෙන් දෙල්තොට, පස්බාගේ කෝරළේ, ගඟ ඉහළ කෝරළේ, උඩදුම්බර, පන්විල ආදී ප්‍රදේශවලට සාපේක්ෂව අඩු අගයක් ගන්නා අතර ප්‍රධාන වශයෙන් වියළි කලාපයේ පිහිටා ඇති මිනිපේ ප්‍රදේශය සාපේක්ෂව වැඩි උෂ්ණත්වයකින් යුක්තය.

මහවැලි ගංගාව දිස්ත්‍රික්කය මැදින් ගලා යන ප්‍රධාන ගංගාව වන අතර එය මුළු දුරෙන් ආසන්න වශයෙන් කි.මී 110 ක දුරක් මහනුවර දිස්ත්‍රික්කය ආශ්‍රිතව ගලා බසී. මහවැලි ගංගාවේ ආරම්භක ජල ධාරා වන හැටන් ගඟ සහ කොත්මලේ ඔය එක් වී මහවැලි ගංගාව නමින් ගලා බැසීම පටන් ගන්නේ ද පස්බාගේ පොල් වතුර නම් ග්‍රාමයේ දී ය. මෙසේ ගලා යන මහවැලි කලාපයක් වේ. එහි ප්‍රධාන කඳු ශිඛරය වන කොබෝනීල ගල, (උස මීටර් 1553.87), දෝතළුගල (උස මීටර් 1642.57) ආදී කඳු වැටිය දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇත. සාමාන්‍ය වර්ෂාපතනය ඉහළ අගයක් ගන්නා මෙම කලාපය මහවැලි ගඟේ සහ අඹන් ගඟේ ප්‍රධාන ජල පෝෂක ප්‍රදේශයක් වේ. ශ්‍රී ලංකාවට ආවේනික ශාක සහ සත්ත්ව ප්‍රජාවට රැකවරණය සලසන නකල්ස් කඳුවැටිය දිස්ත්‍රික්කයේ ස්වභාව සෞන්දර්යය අතින් ඉහළම තැනක් ගන්නා ප්‍රදේශයකි.

හන්තාන කඳු වැටිය, අම්බුළුවාව කන්ද, බලන කඳුවැටිය, අලගල්ල කන්ද වැනි කඳු ප්‍රදේශ මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති අතර කඩියන්ලෙන, ගලබොඩ ආදී සුන්දර දිය ඇළි විශාල ප්‍රමාණයක් ද මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. මේ දිය ඇළි වලින් විශාල ප්‍රමාණයක් අප්‍රකටව පවතින මුත් සුන්දරත්වය අතින් ඉහළ අගයක් ගනී.

**ස්වාභාවික වෘක්ෂලතා**

මහනුවර දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් 41,521 ක් වනාන්තර වශයෙන් පවතී. මෙම භූමි ප්‍රමාණය මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 21 කි. දැඩි රක්ෂිතයන් ලෙස රැක ගත යුතු මෙම වනාන්තර වලින් හෙක්ටෙයාර් 23,317 භූමි ප්‍රමාණයක් ඝණ වනාන්තර වශයෙන් ද හෙක්ටෙයාර් 10,759 ක් විවෘත වනාන්තර සහ හෙක්ටෙයාර් 7,445 ක ප්‍රමාණයක් වන වගා ලෙස ද පවතී. උස් කඳු මුදුන් ආශ්‍රිතව ද වැඩි වන ගහනයක් දක්නට ඇත. මේ හේතුවෙන් ප්‍රදේශයේ ජල උල්පත් වල ආරක්ෂාවට මෙම වනාන්තර ප්‍රමාණය ආරක්ෂා කර ගැනීම දැඩි අවශ්‍යතාවක් වන අතර විවිධ මිනිස් ක්‍රියාකාරකම් නිසා මෙහි පැවැත්මට තර්ජන එල්ලවන අවස්ථා ඇත.

නකල්ස් රක්ෂිතයට අයත් වන විශාල භූමි ප්‍රමාණයක් මහනුවර දිස්ත්‍රික්කයට අයත් වේ. ශ්‍රී ලංකාවට ආවේණික ශාක හා සත්ත්ව වර්ග කීපයකට වාස භූමිය වන මෙම කලාපය දැඩි ස්වාභාවික රක්ෂිතයක් ලෙස නම් කර ඇති ප්‍රදේශයේ විශාල භූමි ප්‍රමාණයක් ද මෙම දිස්ත්‍රික්කයට අයත් වේ. හන්තාන කඳුවැටිය හා උඩවත්ත කැළේ මහනුවර නගරාසන්නයේ පිහිටා ඇති අතර මින් හන්තාන කඳුවැටිය හා උඩවත්ත කැළේ මහනුවර නගරාසන්නයේ පිහිටා ඇති අතර මින් හන්තාන කඳුවැටිය දැඩි පාරිසරික තර්ජනයකට ලක් වූ ප්‍රදේශයකි.

**වන සතුන්**

මහනුවර දිස්ත්‍රික්කයේ වනාන්තර ආශ්‍රිතව විශාල වන සත්ත්ව ප්‍රජාවක් ජීවත් වන අතර අලියා, දිවියා, වඳුරා, වල් ඌරා, කොළ දිවියා, මුවා, වැලි මුවා ඒ අතර ප්‍රධාන තැනක් ගනී.

උඩදුම්බර , මිනිපේ යන ප්‍රදේශ වල වල් අලින් දක්නට ඇති අතර රන්දෙණිගල අභය භූමිය හා උඩදුම්බර මීමුරේ ප්‍රදේශ ආශ්‍රිතව නිරන්තරයෙන් වල් අලි සැරිසරයි. මෙම ප්‍රදේශ වල විශාල ලෙස පැතිරුණු වන ගහණය තුල දිවියන් ද ජීවත් වන අතර ගම්පොළ, හන්තාන, පාතහේවාහැට යන ප්‍රදේශවලින් ද දිවියන් පිළිබඳ විටින් විට වාර්තා වේ. දිස්ත්‍රික්කයේ සෑම ප්‍රදේශයකම කැළෑ ආශ්‍රිතව වඳුරන්, රිලවුන් සහ වල් ඌරන් ජීවත් වන අතර රන්දෙණිගල අභය භූමිය ආශ්‍රිතව තිත් මුවන් ගෝණුන් සහ වැලි මුවන් වැනි සත්ත්ව විශේෂ දක්නට ඇත. මීට අමතරව පක්ෂි විශේෂ විශාල ප්‍රමාණයක් ද ප්‍රදේශය ආශ්‍රිතව ජීවත් වේ.

**වන සතුන්ගෙන් ඇති වන ගැටළු**

කෘෂිකාර්මික ක්ෂේත්‍රයට හා ජන ජීවිතයට වන සතුන්ගෙන් එල්ල වන බලපෑම් දිස්ත්‍රික්කයේ ඇතැම් ප්‍රදේශවල ඉහළ මට්ටමක පවතී. උඩදුම්බර, මිනිපේ සහ පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල ඇතැම් ප්‍රදේශයන්හි ගම් වදින වල් අලි නිසා කෘෂිකාර්මික කටයුතු වලට මෙන්ම මිනිස් ජීවිත වලටද තර්ජනයක් එල්ල වන අවස්ථා පවතී. උඩදුම්බර ප්‍රදේශයේ මීමුරේ ප්‍රාදේශීය හා කොට්ටයාසයේ දකුණින් පිහිටි දේවහන්දිය, මඩුගල්ල හා මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඹගහපැලැස්ස, හඳගනාව, උඩගලදෙබොක්ක, ගලමුදුන ආදී ප්‍රදේශ වලට මෙම ගැටළුව දැඩි ලෙස බලපායි.

රිලවුන් සහ වල් ඌරන්ගෙන් වගාවට සිදුවන හානි දිස්ත්‍රික්කයේ සෑම ප්‍රදේශයකම පාහේ දක්නට ඇති අතර මෙය පාලනය කිරීමට අපහසු ගැටළුවක් බවට පත් වෙමින් තිබේ.

**ජීවන රටාව**

2011 ජන හා නිවාස සංගණනයට අනුව මහනුවර දිස්ත්‍රික්කයේ මුළු ජනගහණය 1,369,899 ක් වන අතර නාගරික, ග්‍රාමීය, වතු යන අංශ තුනම නියෝජනය කරන ජනගහණ රටාවක් පවතී. දිස්ත්‍රික්කයේ මුළු ජනගහනයෙන් 12% ක් පමණ නාගරික අංශය ද, 80% ක් ග්‍රාමීය අංශය ද සහ 8% ක් පමණ ප්‍රතිශතයක් වතු අංශය ද නියෝජනය කෙරේ.

සමස්ථයක් වශයෙන් ගත් කළ මහනුවර දිස්ත්‍රික්කය තුල කෘෂිකාර්මික ආර්ථික රටාවක් දැකිය හැකි අතර දිස්ත්‍රික්කය තුල පවතින මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 189,130 ක් වන අතර ඉඩම් පරිහරණ රටාව දෙස බලන විට අස්වද්දන ලද කුඹුරු ඉඩම් ප්‍රමාණය දිස්ත්‍රික්කයේ මුළු ඉඩම් ප්‍රමාණයෙන් 8.5% ක් පමණ වේ. එසේම තේ, රබර්, පොල්, කුරුඳු,ගම්මිරිස්,කෝපි හා කරාබු වැනි වගාවන් පිළිවෙලින් 11.9%, 0.65%, 24.6%, 0.06%, 3.7%,1.2%, ක් හා 1.7% ක් වශයෙන් වගා කෙරේ.

12% ක් පමණ වන නාගරික ප්‍රදේශ වල අධික ජන ඝනත්වයක් දක්නට ලැබෙන අතර ඔවුන් කර්මාන්ත හා සේවා ක්ෂේත්‍ර යටතේ තම ජීවන වෘත්තීන් වල නිරත වීමක් දක්නට ලැබේ. ඒ අනුව මෙම ක්ෂේත්‍රයන් ඔස්සේ මෙම ජනතාව දිස්ත්‍රික්කයේ ආර්ථිකයට දක්වන දායකත්වය සුවිශේෂී වේ.

**වාරිමාර්ග පද්ධතිය**

මහනුවර දිස්ත්‍රික්කයේ වාරිමාර්ග පද්ධතිය දෙස බැලීමේදී මුරපොළ ඇළ ව්‍යාපාරය, ගම්පොළවෙල ව්‍යාපාරය, උඩුගොඩ බණ්ඩාර ඇළ ව්‍යාපාරය ප්‍රධානතම වාරිමාර්ග පද්ධතීන් ලෙස හඳුන්වා දිය හැක.

මුරපොළ ඇළ ව්‍යාපාරය මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට හා පාතහේවැහැට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 02 ට අයත්ව පවතින අතර ප්‍රධාන ඇළේ දිග කි.මී.15.5 කි. මෙහි වගා වපසරිය අක්කර 1200 ක් වන අතර, වී හා අතිරේක බෝග වගා ප්‍රභේදයක් ලෙස පෙන්වා දිය හැක.මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව 2600 කි.

පාතදුම්බර, පන්විල හා කුණ්ඩසාලේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පවතින උඩුගොඩ බණ්ඩාර ඇළ ව්‍යාපාරයේ ජල මූලාශ්‍රය රවන් ඔය වන අතර ප්‍රධාන ඇළේ දිග කි.මී.7.1 කි. මෙහි වගා වපසරිය අක්කර 405 ක් වන අතර වී හා එළවළු බෝග වගා ප්‍රභේදයක් වේ. උඩුගොඩ බණ්ඩාර ඇළ ව්‍යාපාරය මඟින් පවුල් 1000 ක් ප්‍රතිලාභ ලබනු ඇත.

උලපනේ ඔය ජල මූලාශ්‍රය කොටගත් ගම්පොළවෙල රජ ඇළ ව්‍යාපාරය ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය කොට්ඨාසය තුළ පිහිටා ඇත. මෙහි ප්‍රධාන ඇළේ දිග කි.මී.12.8 ක් වන අතර වගා කරන බිම් ප්‍රමාණය අක්කර 405 කි. මෙමඟින් ප්‍රතිලාභ ලබන පවුල් ප්‍රමාණය 1000 කි.

## 3. 1 පරිපාලන සිතියම





# මූලික තොරතුරු



| | |
|---|---|
| ❖ වර්ග ප්‍රමාණය (ව.කි.මී) | 1940 |
| ❖ පළාත | මධ්‍යම |
| ❖ දිස්ත්‍රික්කය | මහනුවර |
| ❖ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණන | 20 |
| ❖ ග්‍රාම නිලධාරි කොට්ඨාස | 1188 |
| ❖ ගම් හා ජනපද | 2758 |
| ❖ මැතිවරණ කොට්ඨාස ගණන | 13 |
| ❖ මහනගර සභා | 01 |
| ❖ නගර සභා | 04 |
| ❖ ප්‍රාදේශීය සභා | 17 |
| ❖ අධ්‍යාපන කලාප | 06 |
| ❖ පාසැල් සංඛ්‍යාව | 642 |
| ❖ ගුරුවරු සංඛ්‍යාව | 15,767 |
| ❖ ශිෂ්‍ය සංඛ්‍යාව | 269,771 |
| ❖ ශිෂ්‍ය ගුරු අනුපාතය | 17.1% |
| ❖ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සංඛ්‍යාව | 13 |
| ❖ පළාත් සභා මන්ත්‍රීවරු සංඛ්‍යාව | 29 |
| ❖ පළාත් පාලන ආයතන නියෝජිතයන් | 338 |
| ❖ රා.ප.අමාත්‍යාංශය යටතේ වන සංචාරක නිල නිවාස | 01 |
| ❖ පූජ්‍ය පක්ෂය | |
| බෞද්ධ | 3,027 |
| හින්දු | 44 |
| ඉස්ලාම් | 301 |
| රෝමානු කතෝලික | 283 |
| වෙනත් ක්‍රිස්තියානි | 45 |
| ❖ ජනගහනය | |
| 2011 ජන හා නිවාස සංගණනය | 1,369,899 |
| ❖ නිවාස සංඛ්‍යාව | 342,255 |
| ❖ පවුල් සංඛ්‍යාව | 344,681 |

මූලය - ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මහනුවර
සැකසුම:- දිස්ත්‍රික් මෙහෙයුම් ඒකකය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මහනුවර

# 4. සංවිධාන ව්‍යුහය



## 4.1 අනුමත කාර්ය මණ්ඩලය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මහනුවර

| තනතුරු නාමය | කළමනාකරණ සේවා චක්‍ර ලේඛය අනුව අනුමත කාර්ය මණ්ඩලය | සිටින කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|
| **A කාණ්ඩය** | | | |
| දිස්ත්‍රික් ලේකම් (ශ්‍රී ලං.ප.සේ) | 01 | 01 | |
| **B කාණ්ඩය** | | | |
| අතිරේක දිස්ත්‍රික් ලේකම් (ශ්‍රී ලං.ප.සේ) | 01 | 01 | |
| සහකාර දිස්ත්‍රික් ලේකම් (ශ්‍රී ලං.ප.සේ) | 01 | 01 | |
| ප්‍රධාන ගණකාධිකාරී ( ශ්‍රී ලං.ග.සේ) | 01 | 01 | |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක ( ශ්‍රී ලං.ග.සේ) | 01 | 01 | |
| ගණකාධිකාරී ( ශ්‍රී ලං.ග.සේ) | 01 | 01 | |
| දිස්ත්‍රික් ඉංජිනේරු (ශ්‍රී ලං.ඉ.සේ) | 01 | 01 | |
| පරිපාලන නිලධාරි | 01 | 01 | |
| **C කාණ්ඩය** | | | |
| භාෂා පරිවර්තක | 02 | 01 | 01 |
| සංවර්ධන සම්බන්ධීකාරක | 02 | 02 | |
| අයවැය සහකාර | 02 | 02 | |
| තාක්‍ෂණ සේවා නිලධාරි (සිවිල් ) | 01 | 01 | |
| තාක්‍ෂණ සේවා නිලධාරි (සැලසුම්) | 01 | 01 | |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 24 | 23 | 01 |
| පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු | 02 | 02 | |
| පිළිගැනීමේ නිලධාරි | 01 | 01 | |
| **D කාණ්ඩය** | | | |
| රියදුරු | 06 | 06 | |
| කාර්යාල සේවක සේවය | 05 | 07 | |
| සනීපාරක්‍ෂක කම්කරු (කා.සේ.සේ. III) | 02 | 02 | |
| කාර්යාල මුරකරු | 03 | 04 | |
| මුරකරු | 03 | 01 | 02 |
| උද්‍යාන කම්කරු | 01 | - | 01 |
| සංචාරක නිවාස භාරකරු | 02 | 02 | |
| එකතුව | 65 | 63 | 05 |

## 4.2 අංශ අනුව කාර්ය මණ්ඩලය

| අංශය | තනතුර/සේවය | සේවක සංඛ්‍යාව | දුරකථන |
|---|---|---|---|
| | **දිසාපති /දිස්ත්‍රික් ලේකම්** | | 0812222235 |
| | එච්.එම්. ගාමිණී සෙනෙවිරත්න මහතා | | |
| | **අතිරේක දිස්ත්‍රික් ලේකම්** | | |
| | සුනන්ද කාරියප්පෙරුම මහතා | | 0812239241 |
| | **සහකාර දිස්ත්‍රික් ලේකම්** | | |
| | ඒ.එච්.එම්.ඉන්දිකා අබේසිංහ මිය | | 0812239129 |
| 1.ආයතන අංශය | 1.පරිපාලන නිලධාරි - ආර්.ඒ.අජිත් කුමාර මහතා | 01 | 0812224435 |
| | 2.භාෂා පරිවර්තක | 02 | |
| | 3.කළමනාකරණ සහකාර සේවය | 10 | |
| | 4.සංවර්ධන නිලධාරි | 03 | |
| | 5.පරිගණක දත්ත ක්‍රියාකරු | 01 | |
| | 6..වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා | 02 | |
| | 7..පිළිගැනීමේ නිලධාරි | 01 | |
| | 8..කාර්යාල කාර්යය සහයක | 05 | |
| | 9.රියදුරු | 06 | |
| | 10.මුරකරු | 02 | |
| 2.ගිණුම් අංශය | 1.ප්‍රධාන ගණකාධිකාරි ඩබ්.එම්.විජේරත්න මහතා | 01 | 0812233604 |
| | 2.ගණකාධිකාරි | 01 | |
| | 3.අය වැය සහකාර | 02 | |
| | 4.විශ්‍රාම වැටුප් නිලධාරි | 01 | |
| | 5.මූල්‍ය සහකාර | 01 | |
| | 6.කළමනාකරණ සහකාර සේවය | 07 | |
| | 7.පරිගණක දත්ත ක්‍රියාකරු | 01 | |
| | 8.කාර්යාල කාර්යය සහායක | 02 | |
| 3.සංවර්ධන අංශය | 1.දිස්ත්‍රික් ඉංජිනේරු - කේ.බී. කරුණානායක මහතා | 01 | 0815626672 |
| | 2.කාර්මික නිලධාරි | 02 | |
| | 3.සැලසුම් ශිල්පී | 01 | |
| | 4.පරිසර නිලධාරි | 01 | 0812229129 |
| | 5.සංවර්ධන සම්බන්ධීකාරක | 02 | |
| | 6. සංවර්ධන නිලධාරි | 05 | |
| | 7.කළමනාකරණ සහකාර සේවය | 03 | |
| | 8.වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා | 01 | |
| | 9.කාර්යාල සේවක සේවය | 02 | |
| 4.අභ්‍යන්තර විගණන අංශය | 1.ප්‍රධාන අභ්‍යන්තර විගණක - කේ.එස්.පී. ගුණසේකර මහතා | 01 | 0812236762 |
| | 2.රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 | |
| | 3. සංවර්ධන නිලධාරි | 05 | |
| 5.දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අංශය | 1.අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) පී. මුදලිගේ මහතා | 01 | 0812224079 |
| | 2.නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 | 0812201120 |
| | 3. සහකාර අධ්‍යක්ෂ | 01 | |
| | 4. සහකාර අධ්‍යක්ෂ (අධිසේවක) | 02 | |
| | 5. සංවර්ධන නිලධාරි | 06 | |
| | 6. සංවර්ධන සහකාර | 04 | |
| | 7.සැලසුම් ක්‍රියාත්මක කිරීමේ සහකාර | 01 | |
| | 8. කළමනාකරණ සහකාර සේවය | 04 | |
| | 9.වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා | 02 | |
| | 10.රියදුරු | 02 | |
| | 11. කාර්යාල කාර්ය සහයක සේවය | 01 | |

| | | | |
|---|---|---|---|
| 6.දිස්ත්‍රික් සමෘද්ධි අංශය | 1. සහකාර සමෘද්ධි කොමසාරිස් – ඩබ්.එම්.ටී.යූ. විජේරත්න මෙනවිය<br>2. දිස්ත්‍රික් සම්බන්ධීකරන නිලධාරි<br>3. අධීක්ෂණ නිලධාරි<br>4. අධීක්ෂණ කළමණාකරු<br>5. කළමනාකරණ සහකාර<br>6. ප්‍රවර්ධන නිලධාරි<br>7. සමෘද්ධි කළමණාකරුවන්<br>8. සමෘද්ධි සංවර්ධන නිලධාරි<br>10.සමෘද්ධි ලිපිකරු<br>11. සමෘද්ධි කා.කා.ස<br>12.රියදුරු<br>**සමෘද්ධි විගණන අංශය**<br>1.විගණන කළමණාකරු<br>2.අභ්‍යන්තර විගණන නිලධාරි | 01<br>01<br>04<br>01<br>02<br>02<br>08<br>10<br>02<br>01<br>02<br><br>06<br>07 | 0812223603<br>0812233809 |
| 7. සංඛ්‍යා ලේඛන අංශය | 1. දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛනඥ<br>2. සංඛ්‍යා ලේඛන නිලධාරි<br>3. තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන සහකාර<br>4. දත්ත සටහන් ක්‍රියාකරු<br>5. ද.ස.ක්‍රි. / කේත ලිපිකරු<br>6. කළමනාකරණ සහකාර<br>7. රියදුරු<br>8.කාර්යාල කාර්ය සහායක | 01<br>03<br>01<br>01<br>02<br>01<br>01<br>01 | 0812223757 |
| 8.සංස්කෘතික හා ආගමික කටයුතු | 1. සංස්කෘතික නිලධාරි<br>2. සංස්කෘතික සංවර්ධන සහකාර<br>3. බෞද්ධ කටයුතු සමායෝජක<br>4. ජාතික ඒකාබද්ධතා ප්‍ර.සහකාර<br>5. සංවර්ධන නිලධාරි (හින්දු සංස්කෘතික) | 02<br>01<br>01<br>01<br>02 | 0812239241 |
| 9.මාධ්‍ය අංශය | 1.දිස්ත්‍රික් ප්‍රවෘත්ති නිලධාරි<br>2.මාධ්‍ය විමර්ශන නිලධාරි<br>3.ව්‍යාපෘති සහකාර | 01<br>01<br>01 | 0812200149 |
| 10.පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ අංශය | 1.කළමනාකරණ සහකාර<br>2.කාර්යාල කාර්ය සහයක | 02<br>01 | 0812234752 |
| 11.මෝටර් රථ අංශය | 1.මෝටර් රථ පරීක්ෂක<br>2.කළමනාකරණ සහකාර<br>3.සංවර්ධන හා විමර්ශන නිලධාරි<br>4.විමර්ශන සහකාර<br>5.සංවර්ධන සහකාර<br>6. කාර්යාල කාර්ය සහයක | 05<br>05<br>02<br>03<br>06<br>01 | 0812237968 |
| 12.සමාජ සේවා අංශය | 1.මූලස්ථාන සමාජ සේවා නිලධාරි<br>2.සංවර්ධන සහකාර ( රා.නො.ස)<br>3. සංවර්ධන නිලධාරි | 01<br>01<br>01 | |
| 13.සමාජ ආරක්ෂණ අංශය | 1.දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරි II<br>2.රාජ්‍ය කළමනාකරණ සහකාර<br>3.කාර්යාල කාර්ය සහයක | 01<br>02<br>01 | 0812228387 |
| 14.ආපදා කළමනාකරණ අංශය | 1.දිස්ත්‍රික් සම්බන්ධීකාරක<br>2.සම්බන්ධීකරණ සහකාර<br>3සංවර්ධන සහකාර - ආපදා සහන සේවා<br>4.රාජ්‍ය කළමනාකරණ සහකාර<br>5.රියදුරු | 01<br>04<br>01<br>01<br>01 | 0812202697 |

| | | | |
|---|---|---|---|
| 15. ළමා හා කාන්තා කටයුතු අංශය | 1.සහකාර දිස්ත්‍රික් සම්බන්ධිකාරක<br>2.සහකාර දිස්ත්‍රික් මනෝ සමායෝජක<br>3.ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි<br>4. මුල් ළමාවිය සංවර්ධන නිලධාරි<br>5.දිස්ත්‍රික් වනිතා සංවර්ධන නිලධාරි | 01<br>01<br>01<br>01<br>01 | |
| 16.පාරිභෝගික කටයුතු පිලිබඳ අංශය | 1.දිස්ත්‍රික් ප්‍රධානී<br>2.විමර්ශන නිලධාරි<br>3.සංවර්ධන නිලධාරි<br>4.රියදුරු | 01<br>12<br>01<br>01 | 0602826212 |
| 17.මිණුම් ඒකක හා ප්‍රමිත සේවා අංශය | 1.කාර්ය භාර නිලධාරි<br>2.පරික්ෂක නිලධාරි<br>3 සංවර්ධන නිලධාරි<br>4.සහයක වරුන් | 01<br>03<br>02<br>02 | 0812239971 |
| 18.කෘෂිකර්ම අංශය | 1. සහකාර අධ්‍යක්ෂ (පොහොර ලේකම්)<br>2. සංවර්ධන නිලධාරි | 01<br>06 | 0602826212 |
| 19.කුඩා ව්‍යාපාර අංශය | 1.සහකාර අධ්‍යක්ෂ (අධිසේවක)<br>2.ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු කිරිමේ නිලධාරි<br>3.වැඩ සටහන් සහකාර<br>4. සංවර්ධන නිලධාරි | 02<br>02<br>01<br>01 | 0812229180 |
| 20.දිස්ත්‍රික් ක්‍රීඩා අංශය | දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි හා පුහුණුකරුවන් | 08 | 0602808515 |
| 21.මානව සම්පත් සංවර්ධන අංශය | 1.වෘත්තිය මාර්ගෝපදේශන නිලධාරි<br>2.මානව සම්පත් සංවර්ධන සහකාර | 01<br>03 | 0812224678 |
| 22. පුපුරන ද්‍රව්‍ය අංශය | 1.පුපුරණ ද්‍රව්‍ය සහකාර පාලක<br>2.කළමනාකරණ සහකාර<br>3.රියදුරු | 01<br>01<br>01 | 0812222770 |
| 23. ඵලදායිතා අංශය | 1.ඵලදායිතා ප්‍රවර්ධන නිලධාරි<br>2.සංවර්ධන නිලධාරි | 02<br>02 | |
| 24. විමර්ෂණ අංශය | 1.සංවර්ධන නිලධාරි | 05 | |
| 25. දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් | 1.දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි-<br>2.සහකාර ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි<br>3.ඉඩම් පරිහරණ සැලසුම් සහකාර<br>4.සැලසුම් ශිල්පි<br>5.රාජ්‍ය කළමණාකරණ සහකාර<br>6. කාර්යාල කාර්ය සහයක<br>7.රියදුරු | 01<br>04<br>04<br>02<br>01<br>02<br>01 | 0812238830 |
| 26. ජලජීවී වගා සංවර්ධන අංශය | 1.දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරි<br>2.ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරි<br>3.රාජ්‍ය කළමනාකරණ සහකාර<br>4. කාර්යාල කාර්ය සහයක<br>5.රියදුරු | 01<br>02<br>01<br>01<br>01 | 0812234816 |

# 5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධනය

## 5.1 සාමාන්‍ය පරිපාලනය

### 5.1.1 ආයතන අංශ කටයුතු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සමස්ථ කාර්ය මණ්ඩලය හා දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩලයට අදාළ ආයතන කටයුතු, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වාහන වෙන් කිරීම හා නඩත්තු කටයුතු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ ඉඩකඩ සහ භෞතික පහසුකම් පාලනය කිරීම, ජල විදුලි දුරකථන බිල්පත් ගෙවීම සඳහා යොමු කිරීම ආයතන අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබයි. මෙහිදී ආයතන සංග්‍රහය, කාර්ය පටිපාටික රීති හා රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ හා අණපනත් වලට අනුකූලව කටයුතු කළ යුතු වේ.

2013 වසරේදී මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ඒකාබද්ධ සේවයේ නිලධාරින්ගේ ආයතන කටයුතු වශයෙන් කාර්ය මණ්ඩල බඳවා ගැනීම්, ස්ථිර කිරීම්, උසස් කිරීම්, ස්ථානමාරු කිරීම් හා විශ්‍රාම ගැන්වීමේ කටයුතු සිදු කර ඇත.

| අනු අංකය | ක්‍රියාකාරකම/උප ක්රියාකාරකම | |
|---|---|---|
| 1 | පත්කිරීම් සම්බන්ධ කටයුතු | 28 |
| 2 | සේවයේ ස්ථිර කිරීම නිර්දේශ කර යැවීම් | 14 |
| 3 | නිවාඩු සම්බන්ධ නිර්දේශ ලබාදීම | 11 |
| 4 | උසස්වීම් නිර්දේශකර යැවීම | 17 |
| 5 | කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණ | 51 |
| 6 | විශ්‍රාම ගැන්වීම් | 24 |

සියළුම ක්ෂේත්‍රවල නිලධාරින්ගේ කාර්ය සාධන වාර්තා යාවත්කාලීන කර පවත්වා ගැනීම ආයතන අංශය මඟින් ක්‍රියාත්මක කරන අතර ඒ යටතේ පසුගිය වසර තුලදී කාර්ය සාධන ඇගයීම් වාර්තා 126ක් ගිවිසුම් ගතවීම් වාර මැද ඇගයීම /ප්‍රමාණනය කිරීම හා වර්ෂාවසානයේදී ඇගැයීම/ප්‍රමාණනය කර ඇත. මෙම නිලධාරින්ගෙන් සුදුසුකම් ලැබූ සියළුම නිලධාරින්ට අදාළව පසු ගිය වර්ෂයේ වැටුප් වර්ධක අනුමත කර ගෙවීම් කිරීමට කටයුතු කර ඇත. කාර්ය සාධන වාර්තා යාවත්කාලින කිරීම, වැටුප් වර්ධක ගෙවීම හා ඒ හා අදාළව අනෙකුත් කටයුතුවල පසුගිය වර්ෂයේ ප්‍රගතිය පහත සටහනේ දක්වා ඇත. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රාදේශීය ලේකම්වරුන් හැර අනෙකුත් මාණ්ඩලික නිලධාරින්ගේ කාර්ය සාධන වාර්තා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් අත්සන් කළ ද වැටුප් වර්ධක ගෙවීම එම කාර්යාල මඟින්ම කරනු ලැබේ.

| අනු අංකය | ක්‍රියාකාරකම | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | කාර්ය සාධන ඇගයීම් හා ප්‍රමාණනය කිරීම් | 126 |
| 2 | වැටුප් වර්ධක නිර්දේශ කිරීම්/ අනුමත කිරීම් | 87 |
| 3 | විශ්‍රාම වැටුප් ප්‍රදානයන් | 02 |
| 4 | සේවය ස්ථිර කිරීමට නිර්දේශ කිරීම | 03 |
| 5 | නව පත්වීම් අනුව අදාළ පරිශිෂ්ඨ වාර්තා යැවීම් | 17 |

ග්‍රාම නිලධාරි කටයුතු සම්බන්ධයෙන්ද සේවය ස්ථිර කිරීම්, විශ්‍රාම ගැන්වීම්, වැඩ බැලීම සඳහා ග්‍රාම නිලධාරින් පත් කිරීම, ග්‍රාම නිලධාරි පුරප්පාඩු වාර්තා කිරීම්, විදේශ නිවාඩු හා පරිපාලන ග්‍රාම නිලධාරින්ට අදාල රාජකාරින් ආදිය වසර මුළුල්ලේම සිදු කර ඇත. 2013 වර්ෂයට අදාළව එම කටයුතු පහත සටහනේ දක්වා ඇත.

| අනු අංකය | රාජකාරියේ ස්වභාවය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ග්‍රාම නිලධාරි සේවය ස්ථිර කිරීම් වලට අදාල කටයුතු | 12 |
| 2 | කාර්යක්ෂමතා කඩඉම් සම්බන්ධ කටයුතු | 06 |
| 3 | විශ්‍රාම ගැන්වීම් වලට අදාල කටයුතු | 72 |
| 4 | ස්ථාන මාරු කිරීම් සම්බන්ධ ලිපි කටයුතු | 04 |
| 5 | ග්‍රාම නිලධාරි පෙත්සම් සම්බන්ධ කටයුතු | 80 |

| | | |
|---|---|---|
| **6** | විධිමත් විනය පරීක්ෂණ වලට අදාල කටයුතු | 12 |
| **7** | ප්‍රාදේශීය ලේකම් සමුළුව වෙත ප්‍රගතිය ඉදිරිපත් කිරීම් | 12 |
| **8** | වැඩ බැලීම සඳහා ග්‍රාම නිලධාරින් පත් කිරීම | 290 |
| **9** | ග්‍රාම නිලධාරි පුරප්පාඩු වාර්තා | 04 |
| **10** | විදේශ නිවාඩු | 14 |
| **11** | පරිපාලන ග්‍රාම නිලධාරි ස්ථාන මාරුවීම් සම්බන්ධ කටයුතු | 14 |
| **12** | පරිපාලන ග්‍රාම නිලධාරි විශ්‍රාම ගැන්වීම් වලට අදාල කටයුතු | 01 |
| **13** | පරිපාලන ග්‍රාම නිලධාරි වැඩබැලීම් පත්වීම් | 04 |

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පසුගිය වර්ෂයේ ග්‍රාම නිලධාරි පුරප්පාඩු 408 පැවති අතර මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් සම්මුඛ පරීක්ෂන පවත්වා ඇති අතර මහනුවර දිස්ත්‍රික්කයට අදාළ එම කටයුතු ආයතන අංශය මඟින් සංවිධානය කරන ලදි.

ප්‍රාදේශීය පරිපාලනය වඩාත් ශක්තිමත් කිරීම සඳහාත් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර කාර්ය සාධන ඉලක්කයන් සහ ඵලයන් හුවමාරු කර ගැනීමටත් වඩාත් හොඳ ප්‍රගති පාලන ක්‍රමයක් ලෙස ප්‍රාදේශීය ලේකම් සමුළු පැවැත්වීම සාර්ථක වැඩ පිළිවෙලක් බවට පත්ව ඇත. මේ යටතේ පසුගිය වසරේදී ප්‍රාදේශීය ලේකම් සමුළු 10 ක් පවත්වා ඇත. එහිදී කාර්යාල මට්ටමින් හඳුනා ගන්නා ලද අඩුපාඩු පිළිබඳව සාකච්ඡාවට බඳුන් කොට ඒවා කඩිනමින් නිවැරදි කර ගැනීමේ ක්‍රමවේදයක් ද අනුගමනය කිරීම සුවිශේෂ කරුණකි. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ලද යහ පාලනය සඳහා වූ ව්‍යාපෘතිය යටතේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවතින අංශ 07 ක් යටතේ ස්ථාපිත කිරීම 2013 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහනකි. ඒ අනුව මහනුවර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පහත සඳහන් අංශ යටතේ සියළුම රාජකාරී කටයුතු සංවිධානය කර ඇත.

ආයතන අංශය මඟින් ක්‍රියාත්මක කරන නිල නිවාස වෙන් කිරීම, නඩත්තුව හා පාලනය තවත් සුවිශේෂී කාර්යයන් වේ. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් නිල නිවාස 52 ක් තිබෙන අතර පසුගිය වසරේදී නිල නිවාස සම්බන්ධයෙන් සිදුකරන ලද කටයුතු පහත වගුවෙන් ඉදිරිපත් කර ඇත. නිල නිවාස ලබා දීම සම්බන්ධයෙන් පොරොත්තු ලේඛනයක් පවත්වා ගන යන අතර සුදුසු නිලධාරින්ට නිල නිවාස ලබාදීම සඳහා අතිරේක දිස්ත්‍රික් ලේකම්, ප්‍රධාන ගණකාධිකාරී හා පරිපාලන නිලධාරි ගෙන් සමන්විත දිස්ත්‍රික් නිවාස කමිටුවක් මඟින් නිර්දේශ ලබා දෙනු ලබන අතර පසුගිය වර්ෂයේ නිවාස කමිටු 05ක් පවත්වා ඇත.

| අනු අංකය | රාජකාරිය | ප්‍රමාණය |
|---|---|---|
| 1. | වෙන් කරන ලද නිවාස සංඛ්‍යාව | 05 |
| 2. | නිල නිවාස අළුත්වැඩියා කර දෙන ලෙස කරන ලද ඉල්ලීම් | 22 |
| 3. | නිල නිවාස ඉල්ලා ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍ර සම්බන්ධ කටයුතු | 28 |
| 4. | බැංකුගත කරන ලද නිල නිවාස කුලී චෙක්පත් ගණන | 528 |
| 5. | නිල නිවාස ඉල්ලා ඉදිරිපත් කරන ලද අභියාචනා ගණන | 05 |
| 6. | නිල නිවාස වලට අනතුරුදායක ගස් ඉවත් කිරීම් සම්බන්ධ කටයුතු | 05 |
| 7. | පවත්වන ලද නිවාස කමිටු ගණන | 05 |

ආයතන අංශය මඟින් ක්‍රියාත්මක කරන නිදහස් දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම්වලට අදාළව දුම්රිය බලපත්‍ර 73 ක් පසුගිය වර්ෂයේ නිකුත් කර ඇත. දුරකථන, ජල, විදුලි, බිල්පත් ගෙවීම් කිරීමට කටයුතු කර ඇති අතර එම වවුචර්පත්වල මුළු වටිනාකම 5,670,826.37 කි.

උපාධිධාරි අභ්‍යාසලාභීන් බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය යටතේ බඳවා ගත් නවක උපාධිධාරින් 3539 දෙනෙකු පසුගිය වර්ෂයේදී විවිධ රාජ්‍ය ආයතනවලට අනුයුක්ත කර සංවර්ධන නිලධාරි III වන ශ්‍රේණියේ තනතුරු සඳහා ස්ථිර පත්වීම් ලබාදීමට කටයුතු කිරීම ආයතන අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද සුවිශේෂී කාර්යයකි. ඔවුන්ගෙන් 2574 ක් මධ්‍යම රජයේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු යටතේ ස්ථිර සේවයට ඇතුළත්

කර ගෙන ඇති අතර ඉතිරි ප්‍රමාණය 965 පිණිස පළාත් සභාවේ තනතුරු යටතේ ස්ථිර සේවයට බඳවා ගෙන ඇත.

එකවර රාජ්‍ය සේවයට බඳවා ගන්නා ලද මෙම සංවර්ධන නිලධාරීන් විශාල ප්‍රමාණය හා බැඳුණු ආයතන කටයුතු ගණනාවක් ක්‍රියාත්මක කිරීමටද 2013 වර්ෂයේදී සිදු විය. මේ යටතේ ක්‍රියාත්මක කරන ලද ආයතන කටයුතු හා අනෙකුත් ක්ෂේත්‍ර නිලධාරීන්ට අදාළව ක්‍රියාත්මක කරන ලද ආයතන තටයුතු පහත සටහන පරිදි වේ.

- උපාධිධාරී ස්ථාන මාරු කිරීම් 80
- ක්ෂේත්‍ර නිලධාරී ස්ථාන මාරු කිරීම් 10
- රාජකාරී නිවාඩු අනුමත කිරීම් 50
- ක්ෂේත්‍ර නිලධාරී කාර්ය සාධන ඇගයීම් 44
- වැටුප් වර්ධක නිර්දේශ/ අනුමැතිය ලබා ගැනීම 47

රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා අත්තිකාරම් බී ගිණුම යටතේ දේපළ සහ ආපදා ණය ලබාදීම ආයතන අංශය මඟින් සම්බන්ධීකරණය කරනු ලබන අතර ඒ යටතේ 2013 වර්ෂය තුළ දේපළ ණය අයදුම්පත්‍ර 12 ක් රාජ්‍ය බැංකු වෙත නිර්දේශ කර යවා ඇති අතර නිලධාරීන් 65 දෙනෙකු සඳහා ආපදා ණය ලබා දී ඇත. දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ කාමර වෙන් කිරීමට අදාල ඉල්ලීම් 11 ක් ලැබී ඇති අතර එම ඉල්ලීම් සළකා බලා ප්‍රශස්ථ අන්දමින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය සංවිධානය කිරීමට පසුගිය වර්ෂයේදී කටයුතු කර ඇත. 2013 වර්ෂයේදී පැවති පළාත් සභා මැතිවරණය වෙනුවෙන් නිලධාරීන් සේවයේ යෙදවීමට කටයුතු කරන ලද අතර එම මැතිවරණයට අදාළ සම්බන්ධීකරණ කටයුතු ක්‍රියාත්මක කරන ලදි. රාජ්‍ය නිලධාරීන්ගේ 142 ක් සඳහා තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීමට අදාළ පහසුකම් සැලසීම හා ක්‍රියාත්මක කිරීම ආයතන අංශය මඟින් සිදු කරන ලදි. රෙජිස්ට්‍රාර් කටයුතු සම්බන්ධීකරණය, ආර්ථික සංගණනය, ගැටුම් හේතුවෙන් තුවාල ලැබූ/ මියගිය පුද්ගලයන් පිළිබඳ සංගණනය යන රාජකාරී ක්ෂේත්‍රයන්ට අදාළව කටයුතු සම්බන්ධීකරණය කරන ලදි. ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා අබිං නිකුත් කිරීම වෙනුවෙන් අබිං මණ්ඩලය පසුගිය වර්ෂයේදී වාර 02 කදී රැස්වී කටයුතු කර ඇත.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා නිල වාහන 48 ක් ලබාදී ඇති අතර මෙම වාහන කළමනාකරණය ආයතන අංශය මඟින් ක්‍රියාත්මක කරයි. 2013 වර්ෂයේදී මෙම සියලු වාහන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් සර්වග්‍රාහී රක්ෂණ ක්‍රමය යටතේ රක්ෂණය කර ඇති අතර මේ සඳහා වැය කර ඇති මුදල රු. 3,018,397.12 නිල වාහන කළමනාකරණයට අදාළව පසුගිය වසර තුළ සිදු කරන ලද කටයුතු පහත සටහනින් දක්වා ඇත.

| අනු අංකය | වාහන නඩත්තු කටයුත්ත | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන අළුත්වැඩියා කිරීම් | 13 |
| 2 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන සේවා කිරීම් | 25 |
| 3 | වාහන රක්ෂණය කිරීම් | 48 |
| 4 | වාහන පවරා ගැනීම | 01 |
| 5 | ඉන්ධන දහන පරීක්ෂා කිරීම් | 02 |
| 6 | නිල වාහන පෞද්ගලික පරිහරණයට හා පැදවීමට අනුමැතිය ලබා දීම | 05 |
| 7 | වාහන වෙනත් අමාත්‍යාංශ වෙත පවරා දීම | 01 |
| 8 | වාහන අනතුරු සම්බන්ධ කටයුතු | 11 |

**2013 වසරේ විවිධ මහජන ඉල්ලීම්/ලිපි/පෙත්සම් හා මහජන ඉඩම් ගැටළු හා විදුලි විරෝධතා.**

| ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබුණු ලිපි / පෙත්සම් | මහජන ඉඩම් ගැටළු | මහජන පෙත්සම් / ලිපි | විදුලි විරෝධතා |
|---|---|---|---|
| 27 | 143 | 105 | 19 |

**2013 වසර තුළ කොස් ගස් හා දෙල් ගස් හෙළීමට අනුමැතිය ලබා දීම**

| දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය ලැබීම | | කෘෂිකර්ම අමාත්‍යාංශයේ අනුමැතිය ලැබීම | |
|---|---|---|---|
| කොස් ගස් | දෙල් ගස් | කොස් ගස් | දෙල් ගස් |
| 1360 | 95 | 592 | 10 |

## 5.1.2 දිස්ත්‍රික් මාධ්‍ය ඒකකයේ කටයුතු

මහනුවර දිස්ත්‍රික්කයේ සමාජ, ආර්ථික, දේශපාලන, ආගමික හා සංස්කෘතික සංවර්ධනයට මාධ්‍ය දායකත්වය ලබාදීම තුලින් ජනතාව වෙත තොරතුරු ලබාදීම හා දැනුවත් කිරීම ප්‍රධාන අරමුණු වේ.

### දිස්ත්‍රික් මාධ්‍ය ඒකකයේ ප්‍රධාන කාර්යයන්

1. දිස්ත්‍රික්කයේ සංවර්ධනයට අදාලව ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරීම.
2. දිස්ත්‍රික් ප්‍රධාන රැස්වීම්වල තීන්දු වලට අදාලව නිවේදන නිකුත් කිරීම.
3. සන්නිවේදනයට අදාල වැඩමුළු, සම්මන්ත්‍රණ සංවිධානය කිරීම.
4. පාසල් ජනමාධ්‍ය කව දැනුවත් කිරීම.



ජනමාධ්‍ය හදාරණ සිසුන් වෙනුවෙන්
ජනමාධ්‍ය අධ්‍යයනය පිළිබඳව සම්මන්ත්‍රණය

### 2013 වර්ෂයේ ප්‍රගතිය

01 . ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරීම. - 144
02 . මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු. - 60
03 . මාධ්‍ය ආවරණ කටයුතු. - 75
04 . ඓතිහාසික ඇසළ පෙරහරට සමගාමීව සිරිදළදා අභිවන්දන සමරු කලාපය නිකුත් කිරීම.
05 . රජයේ නිලපුවත් වෙබ් අඩවියට ප්‍රවෘත්ති සැපැයීම.
06 . දෛනිකව පුවත්පත් නිරීක්ෂණය කොට මහනුවර දිස්ත්‍රික්කයට අදාල පුවත් දිසාපතිවරයා වෙත යොමු කිරීම.
07 . දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වෙබ් අඩවි සම්බන්ධ කටයුතු කිරීම.
08 . දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුස්තකාලයේ පොත් බැහැර දීම හා එහි සංවර්ධන කටයුතු.
09. පාසැල්වල ජනමාධ්‍ය හදාරණ සිසුන් වෙනුවෙන් ජනමාධ්‍ය අධ්‍යයනය පිළිබඳව සම්මන්ත්‍රණ පැවැත්වීම ( මහනුවර විද්‍යාර්ථ විද්‍යාලය හා නුගවෙල මැදි විදුහල)
10. 2013වර්ෂයේ මහනුවර දිස්ත්‍රික්කයේ පැවැති ප්‍රධාන ජාතික වැඩසටහන්, ආගමික හා සංස්කෘතික වැඩසටහන් හා සංවර්ධන වැඩසටහන් සඳහා මාධ්‍ය ආවරණය ලබාදීම.
11. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරින්ගේ උපන්දින වෙනුවෙන් සුභ පැතුම්පතක් යැවීම.
12. 2013 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විවිධ අංශ මගින් සිදුකරන ලද විශේෂිත වැඩසටහන් ඡායාරූප ගත කිරීම හා විඩියෝ කිරීම.
13. මහනුවර දිස්ත්‍රික්කයේ ජනමාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩමුළුක් පැවැත්වීම.
14. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පවත්වන ලද විශේෂිත වැඩසටහන් හා උත්සව නිවේදන කටයුතු
15. මහනුවර දිස්ත්‍රික් දුරකථන නාමාවලියට අවශ්‍ය සියළු තොරතුරු ලබාගෙන ඇත.
16. මාසිකව පැවැත්වෙන ප්‍රාදේශීය ලේකම් සමුළු මාධ්‍ය ආවරණ කටයුතු
17. දළදා වහන්සේ සම්බන්ධයෙන් රචිත සිරිදළදා හරසරණිය ග්‍රන්ථය අවසන් සෝදුපත් බැලීමෙන් අනතුරුව මුද්‍රණයට භාරදී ඇත.
18. මහනුවර දිස්ත්‍රික් ප්‍රාදේශීය ලේකම් සමුළුව සම්බන්ධයෙන් වාර්තාමය වැඩසටහනක් සකස් කිරීම.

### 5.1.3 අභ්‍යන්තර විගණන කටයුතු

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුල පවත්වා ගෙන යනු ලැබූ අභ්‍යන්තර විගණන ඒකකය 2012 වසරේ අගෝස්තු මස සිට වෙනම අංශයක් වශයෙන් ස්ථාපිත කරනු ලැබීය.

**කාර්යභාරය**

දිස්ත්‍රික් ලේකම් (ගණන්දීමේ නිලධාරි) ගේ පාලනය යටතේ පවත්නා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ එයට අනුබද්ධ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 හිද ආයතන, පරිපාලන, සංවර්ධන හා මූල්‍ය කටයුතු පිළිබඳව පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමය පරීක්ෂාකර එම කටයුතු වල වැරදි (දෝෂ හා අඩුපාඩු) සොයා බලා ප්‍රතිකර්ම නිර්දේශ කිරීම, වංචා වැලැක්වීම සහ ඒවා අනාවරණය කර ගැනීම සඳහා අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත් භාවය හා ප්‍රමාණාත්මක භාවය පිළිබඳ අඛණ්ඩ සමීක්ෂණ හා ස්වාධීන ඇගයීම සිදුකර ඵලදායී යහපාලනයකටත් රාජ්‍ය සම්පත්වල මනා කළමනාකරණයකට අවශ්‍ය සහාය ලබාදීමත් අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රමුඛ කාර්යයන්ය.

එසේම දිස්ත්‍රික්කය පුරා විසිර සිටින සේවාලාභීන් දිස්ත්‍රික් ලේකම් වෙත හා අනෙකුත් අදාල අංශ වෙත ඉදිරිපත් කරනුලබන පැමිණිලි හා පෙත්සම් පිළිබඳව අවශ්‍ය අවස්ථාවල දී දිස්ත්‍රික් ලේකම්ගේ නියෝග අනුව කරුණු සොයා බැලීම, තොරතුරු ලබා ගැනීම හා වාර්තා කිරීම, අභ්‍යන්තර විගණනය හා වෙනත් සෝදිසි මගින් අනාවරණය කර ගන්නා ක්‍රම විරෝධී හා රෙගුලාසි වලට අනුකූල නොවන කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාවන්හිදී මූලික විමර්ෂණ පවත්වා වාර්තා කිරීම හා විනය කටයුතු සඳහා අවශ්‍ය සහය ලබාදීමත්ය.

2013.01.02. දින සිට ගණන්දීමේ නිලධාරිගේ සෘජු පාලනය යටතේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ අධීක්ෂණයෙන් අභ්‍යන්තර විගණකවරුන් විසින් මෙම අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ලැබේ.

| අනු අංකය | ඉලක්ක ගත වැඩසටහන / ව්‍යාපෘතිය / ක්‍රියාකාරකම | ඉලක්කය | ඉටු කළ සංඛ්‍යාව | ඉලක්කය හා ප්‍රගතිය අතර සැලකිය යුතු වෙනසක් වේ නම් එයට හේතු |
|---|---|---|---|---|
| 01 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සිදුකර වාර්තා කිරීම. | 21 | 16 | කාර්ය මණ්ඩලයේ දෙදෙනෙකු දීර්ඝ කාලීනව නිවාඩු ලබා ගැනීම හා විගණන නිලධාරින් පුහුණු වැඩසටහන් වලට සහභාගී වීම, මැතිවරණ වැනි අතිරේක රාජකාරී පැවතීම |
| 02 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම හා පසු විපරම් කිරීම. | 50 | 30 | විගණන විමසුම් අඩුවෙන් ලැබී ඇත. |
| 03 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීම, විගණන විමසුම් යැවීම, නිරීක්ෂණ ගෙන්වා ගැනීම. | 21 | 16 | කාර්ය මණ්ඩලයේ දෙදෙනෙකු දීර්ඝ කාලීනව නිවාඩු ලබා ගැනීම හා විගණන නිලධාරින් පුහුණු වැඩසටහන් වලට සහභාගී වීම, මැතිවරණ වැනි අතිරේක රාජකාරී පැවතීම |
| 04 | දිස්ත්‍රික් ලේකම් වෙත ලැබෙන පැමිණිලි හා පෙත්සම් පිළිබඳව දිස්ත්‍රික් ලේකම්ගේ නියෝගය අනුව කරුණු සොයා බැලීම, විමර්ෂණ පවත්වා වාර්තා කිරීම. | 06 | 02 | පැමිණිලි අඩු වීම |

| | | | | |
|---|---|---|---|---|
| **05** | අභ්‍යන්තර විගණන හා වෙනත් සෝදිසි මගින් අනාවරණය කර ගන්නා ලද වංචා හා දූෂණ සම්බන්ධයෙන් මූලික විමර්ශණ පවත්වා වාර්තා ඉදිරිපත් කිරීම. | **02** | **02** | තවත් පරීක්ෂණ දෙකක කටයුතු කර ගෙන යනු ලබයි. |
| **06** | විගණන වාර්තා වලට රාජ්‍ය ගිණුම්කාරක සභාවේ විමර්ෂණයට අනුව අවශ්‍ය තොරතුරු ලබා දීම. 2012 | **01** | **01** | |
| **07** | ප්‍රාදේශීය ලේකම් සමුළු වලට සහභාගී වීම හා ප්‍රාදේශීය ලේකම් සමුළුවේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳ පසු විපරම් කිරීම හා වාර්තා යැවීම | **-** | **07** | |
| **08** | අභ්‍යන්තර විගණන නිලධාරින් පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම ප්‍රධාන අභ්‍යන්තර විගණක පුහුණු වැඩසටහන් සංවර්ධන නිලධාරි පුහුණු වැඩසටහන් | | **03**<br>**03** | |
| **09** | සමෘද්ධි අධිකාරියේ වත්කම් සත්‍යාපනය සඳහා මහනුවර දිස්ත්‍රික්කයට අයත් සියළුම සමෘද්ධි බැංකු මහ සංගම් සහ සමෘද්ධි මූලස්ථාන නිල්ලඹේ පුහුණු මධ්‍යස්ථානය විගණනය කර මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම | | | ආයතන සංඛ්‍යාව 133 |

### 5.1.4 දිස්ත්‍රික් විගණන හා කළමනාකරණ කමිටුව

2000.03.15 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ පීඑෆ්/පීඊ 7 අනුව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විගණන හා කළමණාකරණ කමිටුව ස්ථාපිත කරන ලදී.

**කමිටු සංයුතිය**

සභාපති - එච්.එම්.ගාමිණී සෙනවිරත්න මහතා  දිස්ත්‍රික් ලේකම් / දිසාපති
සාමාජික - ඩබ්.එම්.විජේරත්න මහතා  ප්‍රධාන ගණකාධිකාරි
සාමාජික - ඩී.එම්.එන්.ටී.කරුණාරත්න මහතා  ප්‍රාදේශීය ලේකම්, ගඟවට කෝරළේ

**අනෙකුත් කමිටු සාමාජිකයන්**

අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)
ප්‍රධාන අභ්‍යන්තර විගණක
විගණන අධිකාරි
සංවර්ධන සම්බන්ධීකාරක

**විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්යභාරය**

මූල්‍ය විචක්ෂණභාවය හා මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ අරමුණින් පහත සඳහන් කාර්යයන් ප්‍රධාන වශයෙන් මෙම කමිටුවේ අවධානයට ලක් කෙරේ.

* වාර්ෂික ඇස්තමේන්තුව හා ප්‍රසම්පාදන සැලැස්ම සැකසීම.
* වත්කම් කළමනාකරණය හා භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම.
* ආයතන කටයුතු, මූල්‍ය කටයුතු ඇතුළු සියළුම පරිපාලන කටයුතු සම්බන්ධ අභ්‍යන්තර පාලන ක්‍රමයන්හි කාර්යක්ෂමතාවය මැන බැලීම.
* වාහන පිරිවැය කාර්තු වාර්තා පිළියෙල කිරීම හා ඒවා නිරීක්ෂණය කිරීම.

* ගිණුම් සැසඳීම.

* වියදම් විශ්ලේෂණය කිරීම.

* අභ්‍යන්තර විගණන ඒකකයේ කාර්යයන් සමාලෝචනය කිරීම.

* වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව සැකසීම ආදි කටයුතු සිදු කිරීම.

## විගණන හා කළමනාකරණ කමිටු ප්‍රගතිය - 2013

| 2013 වර්ෂය තුල පැවති විගණන හා කළමනාකරණ කමිටු සංඛ්‍යාව | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | හතරවන කාර්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| | 01 | 01 | 01 | 01 | 04 |

| කමිටු රැස්වීම් වලදී ගන්නා ලද විශේෂ තීරණයන් හා ඒවා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය | |
|---|---|
| * වාහන අළුත්වැඩියා කිරීමේ පිරිවැය කාර්තු වාර්තා කමිටුව වෙත ඉදිරිපත් කිරීම හා ඒවා නිරීක්ෂණයට ලක් කිරීම. | නිසි පරිදි නිරීක්ෂණයන්ට භාජනය විය. |
| * 2013 වසර තුළදී පවත්වනු ලැබූ මාණ්ඩලික හා කාර්යමණ්ඩල රැස්වීම් වලදී ගනු ලැබූ තීරණ සාකච්ඡා කිරීම | විශේෂ තීරණයන් පිළිබඳව සාකච්ඡාවට ගන්නා ලදි |
| * රේඛීය අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු සඳහා ප්‍රතිපාදන වෙන්වූ ආකාරය පිළිබඳව විමසා බැලීම. | සාකච්ඡාවට බඳුන් විය |
| * වියදම් විශ්ලේෂණය | විශ්ලේෂණ වාර්තා කමිටුවට ඉදිරිපත් කර ඒවා නිරීක්ෂණය කර ඇත. |
| * 2013 වසරේ සිට ඉදිරියට වසර 03 ක් සඳහා සංයුක්ත සැලැස්ම සකස් කිරීම | අවසන් |
| * 2012 කාර්ය සාධන හා ගිණුම් වාර්තාව සකස් කර පාර්ලමේන්තුවට ඉදිරිපත් කිරීම | අවසන් |
| * ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් පවත්වනු ලබන රැස්වීම්/ප්‍රගති සමාලෝචනයන් පිළිබඳව තොරතුරු කමිටුවට ඉදිරිපත් කිරීම | අදාළ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ලබා ගෙන ඇත. |
| * 2013 වාර්ෂික ඇස්තමේන්තුවලට අදාළ ප්‍රගතිය | ප්‍රගතිය කමිටුවට ඉදිරිපත් විය. |
| * වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම | ප්‍රගතිය විමසා බලන ලදී. |

## 5.1.5 දිස්ත්‍රික් ආපදා කළමණාකරණ කටයුතු - 2013

2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ව්‍යසන කළමණාකරණ පනත අනුව හදිසියේ ඇතිවන්නා වූ ස්වභාවික ව්‍යසනකාරී තත්ත්වයන් වළක්වා ගැනීම අරමුණු කර ගත් මෙම ඒකකයේ ප්‍රධාන කාර්යභාරයන් අතර ;

* ආපදා අවම කිරීමේ ව්‍යාපෘතීන් සංවිධානය හා ක්‍රියාත්මක කිරීම
* ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කිරීම
* හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය හා තොරතුරු තාක්ෂණ ආයතනය පවත්වා ගෙන යෑම
* පාසල් අපදා කළමනාකරණ සැලැස්ම සැකසීම හා ආපදා සහන සේවා කටයුතු ආදිය ප්‍රධාන වේ.

**2013 වසර තුළදී සිදු කරන ලද වැඩසටහන් ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහන/ව්‍යාපෘතිය | සංඛ්‍යාව | වැයවූ මුදල රු. | ස්ථානය/ආයතනය |
|---|---|---|---|---|
| 1. | ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | 02 | 4,111,026.21<br>1,306,263.07 | ඇලකන්ද විලානගම ප්‍රධාන ඇල සංවර්ධනය කිරිම .<br>නිත්තවෙල රජයේ නිවාස සංකීරණයේ නායයෑම් අවමකිරීමේ ව්‍යාපෘතිය |
| 2. | පෙරසූදානම් හා සැළසුම් සකස් කිරීමේ වැඩසටහන් | | | |
| | ❖ දිස්ත්‍රික් මට්ටමේ ආපදා කළමනාකරණ සැළසුම් සකස් කිරීමේ වැඩසටහන | 01 | 56,837.00 | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| | ❖ ප්‍රාදේශීය ආපදා පෙර සූදානම් සහ ප්‍රතිචාර දැක්වීමේ සැළසුම් සකස් කිරිම | 04 | 64,984.75 | දෙල්තොට, තුම්පනේ, ගඟවටකෝරළය, හතරලියද්ද |
| | ❖ ග්‍රාමීය ආපදා කළමනාකරණ පෙර සුදානම් සහ සැළසුම් සකස් කිරිම | 05 | 19,385.00 | උඩුදුම්බර,යටිනුවර, පාතහේවාහැට, පූජාපිටිය |
| | ❖ පාසල් ආපදා කළමනාකරණ සැළසුම් සකස් කිරීමේ වැඩසටහන | 02 | - | පස්බාගේ කෝරළය, |
| | ❖ වේලි ආරක්ෂණ පෙරහුරු පැවැත්විම | 04 | 87,633.00 | උඩපළාත |
| | ❖ නායයෑම් අවදානම් පෙරහුරු පැවැත්විම | 03 | 27,740.00 | දෙල්තොට, මැදදුම්බර, උඩපළාත |
| 3. | පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් | | | |
| | • දිස්ත්‍රික් මට්ටමේ ආපදා කළමනාකරණ දැනුවත්කිරිම් | 01 | 17,232.00 | පල්ලේකැලේ යුධ හමුදා මූලස්ථානය |
| | • ප්‍රාදේශීය මට්ටමේ ආපදා කළමනාකරණ දැනුවත්කිරිම් | 02 | 30,783.00 | ගඟවටකෝරළය, උඩදුම්බර |
| | • පළාත් පාළන මට්ටමේ නිළධාරින් දැනුවත් කිරිම | 01 | 17,650.00 | මහනුවර මහනගර සභාව |
| | • රාජ්‍ය නිලධාරින් දැනුවත් කිරිම | 02 | 41,452.50 | උඩුදුම්බර, මහනුවර අධ්‍යාපන කලාපය |
| | • පාසල් ආපදා කළමනාකරණ දැනුවත්කිරිම් | 02 | 26,564.50 | මහනුවර අධ්‍යාපන කලාපය, ධර්මාශොක විද්‍යාලය |
| | • ප්‍රථමාධාර සහ කඳවුරු කළමනාකරණ වැඩසටහන් | 02 | 34,635.25 | අකුරණ, යුධහමුදා කඳවුර පල්ලේකැලේ |
| 4. | මුළුතැන්ගෙයි උපකරණ කට්ටල මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන ලබා දීම | 05 | 503,625.00 | පස්බාගේකෝරළය, පාතහේවාහැට, මැදදුම්බර, දොළුව, මිණිපේ |

| | | | | |
|---|---|---|---|---|
| 5. | ආපදාවට ලක්වූ ජනතාවට වියළි සලාක ලබා දිම | 14 | 452,722.00 | මැදදුම්බර, ගඟවටකෝරළය, උඩපළාත, පාතදුම්බර, පූජාපිටිය, පාතහේවාහැට, දොළුව, යටිනුවර, ගලගෙදර, උඩුනුවර, මිණිපේ, හතරලියද්ද, පස්බාගේකෝරළය, දෙල්තොට |
| 6. | නියඟයෙන් පීඩාවට පත් ජනතාව සඳහා පානීය ජලය ලබා දීම | 01 | 165,000.00 | මිණිපේ |
| 7. | ආපදා වලින් මරණයට පත්වූවන් වෙනුවෙන් මරණාධාර ප්‍රතිපාදන ලබා දීම | 09 | 165,000.00 | උඩපළාත, පාතදුම්බර, කුණ්ඩසාලේ, පූජාපිටිය, යටිනුවර, මිණිපේ, හතරලියද්ද, පස්බාගේ කෝරළය, දෙල්තොට |
| 8. | ආපදාවලට ලක්වූවන් සඳහා පිසූ ආහාර ලබා දිම සඳහා ප්‍රතිපාදන | 07 | 495,814.25 | මැදදුම්බර, ගඟවට කෝරළය, උඩපළාත, පාතහේවාහැට, දොළුව, හතරලියද්ද, පස්බාගේකෝරළය |
| 9. | හදිසි ආපදා ප්‍රතිචාර ප්‍රතිපාදන | 28 | 2,894,688.78 | අකුරණ, දොළුව, උඩදුම්බර, යටිනුවර, පූජාපිටිය, පාතහේවාහැට, කුණ්ඩසාලේ, දෙල්තොට, තුම්පනේ, ගඟවටකෝරළය, පන්විල, පස්බාගේකෝරළය, උඩුනුවර |
| 10. | දළදා පෙරහැර සඳහා හදිසි මෙහෙයුම් ඒකකය මෙහෙයවීම | 01 | - | - |
| 11. | ජාතික ක්‍රීඩා උළෙල සඳහා අවශ්‍ය වූ ප්‍රථමාධාර සේවාව සම්බන්ධීකරණය කිරිම | 01 | - | - |

### 5.1.6 පුහුණු හා මානව සම්පත් සංවර්ධන කටයුතු

#### 5.1.6.1 පුහුණු වැඩසටහන් - 2013

රාජ්‍ය නිලධාරින්ගේ දැනුම, ආකල්ප හා කුසලතා ප්‍රවර්ධනය කිරීම තුලින් කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් සැපයීමට සමත් මහජනතාවට ගෞරවාන්විතව සලකන රාජ්‍ය නිලධාරින් පිරිසක් බිහි කිරීම ප්‍රධාන අරමුණු කරගෙන මෙම ඒකකයේ කටයුතු සංවිධානය කර ඇත. රාජ්‍ය සේවයේ විවිධ ශ්‍රේණිවල පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පසු විපරම් හා ඇගයීමේ කටයුතු, විවිධ ආයතන වලින් සංවිධානය කරනු ලබන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරින් යොමු කිරීම, විදේශීය පුහුණු හා ශිෂ්‍යත්ව කටයුතු, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට අයත් මහනුවර බහිරවකන්ද සංචාරක නිවාසය වෙන් කිරීමට අදාල කටයුතු මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරයන් වේ. මෙම කටයුතු ඉටු කිරීම සඳහා සංවර්ධන සම්බන්ධීකාරක නිලධාරින් දෙදෙනකු හා වැව්ලි ප්‍රජා සන්නිවේදන පහසුකම සලසන්නකු අනුයුක්ත කොට ඇත.

2013 වර්ෂයේදී පුහුණු වැඩසටහන් 25 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් පවත්වා ඇති අතර මේ සඳහා මාණ්ඩලික හා මාණ්ඩලික නොවන විවිධ තනතුරු වල නිලධාරින් 666 ක් සහභාගී වී ඇත. මේ සඳහා වැය කරන ලද මුළු මුදල රු. 572,262.75ක ප්‍රමාණයකි. මෙම පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමේදී මහජනතාවට වඩාත් සමීප රාජකාරී ක්ෂේත්‍රයන් පිළිබඳව අවධානය යොමු කරමින් කටයුතු කර ඇත. මේ අනුව පහත සටහනේ දක්වා ඇති පරිදි එම වැඩසටහන් සංවිධානය කිරීමට 2013 වර්ෂයේදී හැකියාව ලැබුණි. පසුගිය වර්ෂය සඳහා ලැබුණු සීමිත මුදල් ප්‍රමාණය උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව අත්‍යවශ්‍ය පුහුණු වැඩසටහන් සඳහා යොමු කරමින් නිලධාරින් විශාල ප්‍රමාණයක් පුහුණු කිරීමට හැකියාව ලැබීම අප ලද ජයග්‍රහණයකි.

| අනු අංකය | පුහුණු පාඨමාලාවේ නම | පැවැත් වූ පාඨමාලා ගණන | සහභාගී වූ නිලධාරින් සංඛ්‍යාව | වියදම (රු) |
|---|---|---|---|---|
| 01 | මූලික පරිගණක පුහුණුව | 02 | 24 | 44215.00 |
| 02 | වවුචර්පත් සැකසීම හා ඒ සම්බන්ධ විගණන කටයුතු | 01 | 68 | 11625.00 |
| 03 | උසස් පරිගණක පුහුණුව | 02 | 23 | 40420.00 |
| 04 | **MS Power Point** පරිගණක පුහුණුව | 03 | 32 | 25068.00 |
| 05 | රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පුහුණුව | 01 | 102 | 73520.00 |
| 06 | **CIGAS – Window Base** | 01 | 38 | 168776.00 |
| 07 | කාර්යාල කාර්ය සහායක පුහුණුව | 01 | 24 | 15570.00 |
| 08 | කාර්යාල උපකරණ භාවිතය හා නඩත්තුව පිළිබඳ වැඩමුළුව | 01 | 24 | 15570.00 |
| 09 | **Ms Access** පරිගණක | 02 | 24 | 25871.00 |
| 10 | **Open Source Software** | 02 | 20 | 24684.25 |
| 11 | සිගාස් පුහුණු වැඩමුළුව හා සම්මන්ත්‍රණය - 2014 වර්ෂය සඳහා | 01 | 39 | 23312.50 |
| 12 | **Page Maker/In Designing** | 02 | 26 | 26025.00 |
| 13 | විනය ක්‍රියා පටිපාටිය පිළිබඳ පුහුණුව (ස.ප්‍රා.ලේ.වරුන්,ගණකාධිකාරිවරුන්.පරිපාලන නිලධාරින් සඳහා) | 01 | 34 | 33880.00 |
| 14 | ආයතන සංග්‍රහය, මූල්‍ය රෙගුලාසි, කාර්යාල කළමනාකරණ (නවක උපාධිධාරි සංවර්ධන නිලධාරින් සඳහා) | 01 | 42 | 5610.00 |
| 15 | ව්‍යාපෘති කළමනාකරණය (නවක උපාධිධාරි සංවර්ධන නිලධාරින් සඳහා) | 01 | 42 | 10,275.00 |
| 16 | උපචිත පදනම මත රාජ්‍ය ගිණුම් පිළියෙල කිරීම පිළිබඳ ගණකාධිකාරිවරුන් දැනුවත් කිරීමේ එක් දින වැඩමුළුව | 01 | 38 | 28,876.00 |
| 17 | ක්‍රියාත්මක සැලැස්ම සැකසීම හා ලිපි ගොනුකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන (ක්ෂේත්‍ර නිලධාරින්) | 01 | 71 | 6,600.00 |
| | මුළු එකතුව | 25 | 666 | 572,262.75 |

පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමේදී රජයේ නිලධාරීන්ගේ පරිගණක සාක්ෂරතාවය ඉහල නැංවීම සඳහා අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය කාරණයක් ලෙස හඳුනා ගත් අතර ඒ අනුව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මූල්‍ය ප්‍රතිපාදන ලබාගෙන 2013 වර්ෂයේදී කටුගස්තොට රාජ්‍ය සේවා පුහුණු ආයතනයේ පරිගණක ඒකකයක් ස්ථාපිත කිරීමට ලැබීම විශේෂිත කාරණයකි. පරිගණක 15 කින් සමන්විත මෙම ඒකකය සඳහා රුපියල් 1,625,000.00 ක ප්‍රමාණයක් වැය කරන ලදි.

ඉහතින් සඳහන් කළ පුහුණු වැඩසටහන්වලට අමතරව පසුගිය වර්ෂයේදී මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරීන් 450 ක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පුහුණු සඳහා යොමු කර ඇති අතර නිලධාරීන් 305 ක් ප්‍රමාණයක් අනිකුත් රාජ්‍ය ආයතන විසින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරවන ලදි.

**මහනුවර සංචාරක නිවාස කටයුතු**

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශයට අයත් 1999 සැප්තැම්බර් 02 දින ආරම්භ කරන ලද මහනුවර සංචාරක නිවාසය බහිරවකන්ද විහාරස්ථානය පාමුල මනරම් කඳුවැටියක මහනුවර නගරය අලංකාරව දර්ශනය වන පරිදි පිහිටා ඇත. රාජ්‍ය සේවයේ නිලධාරීන් සහ විශ්‍රාමික නිලධාරීන් සඳහා වෙන් කරන මෙම සංචාරක නිවාසයේ කාමර වෙන් කිරීම මඟින් 2013 වර්ෂය තුල රු.101,900.00 ක ආදායමක් උපයා ඇත. මහනුවර සංචාරක බංගලාවේ බිම් මහලේ කාමරය "විශේෂිත පුද්ගලයින් සඳහා වූ" කාමරයක් ලෙස 2013 වසර අග භාගයේදී වැඩි දියුණු කිරීම් ඇතුළුව සංචාරක බංගලාවට අවශ්‍ය ගෘහ භාණ්ඩ/උපකරණ මිළදී ගැනීම සඳහා වෙන් වූ ප්‍රතිපාදන මුදල රු.300,086.00 කි.

## 5.1.6.2 මානව සම්පත් හා වෘත්තීය මාර්ගෝපදේශන කටයුතු - 2013

ඵලදායිතා ප්‍රවර්ධන මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව යටතේ මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ස්ථාපිත මානව සම්පත් හා වෘත්තීය මාර්ගෝපදේශන අංශය මඟින් තරුණ තරුණියන්ගේ රැකියා වියුක්තිය අවම කිරීම සඳහා ඔවුන්ගේ විභව ශක්තීන් හඳුනා ගනිමින් මානව සම්පත වඩාත් ඵලදායි ලෙස රටේ සංවර්ධනයට දායක කරලීම උදෙසා රැකියා නිර්මාණය හා ප්‍රවර්ධනයත්, වෘත්තීය මාර්ගෝපදේශනයත් ලබා දීමත් අරමුණු කරගත් මෙම අංශය, එක් වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරියෙකුගෙන් හා මානව සම්පත් සහකාරවරුන් තිදෙනෙකුගෙන් සමන්විතය.

| අනු අංකය | වැඩසටහන | ඉලක්කය | ඉටුකළ ගණන | ප්‍රතිලාභීන් ගණන | වියදම රු. |
|---|---|---|---|---|---|
| 01 | රැකියා සමාජ වැඩසටහන | 06 | 06 | 180 | 124200.00 |
| 02 | ප්‍රාදේශීය රැකියා පොළ | 19 | 19 | 3920 | 14000.00 |
| 03 | පුද්ගලික අංශයේ රැකියා ගත කිරීම | 01 | 01 | 75 | 19200.00 |
| 04 | නිදහස් රැකියා සඳහා පෙළඹවීමේ වැඩසටහන | 01 | 01 | 30 | 11460.00 |
| 05 | ජංගම දුරකථන අළුත්වැඩියා කිරීම | 01 | 01 | 30 | 23500.00 |
| 06 | ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු | 02 | 02 | 60 | 41100.00 |
| 07 | අවශ්‍යතා මත පුහුණු | 05 | 08 | 160 | 32750.00 |
| 08 | සාමාන්‍ය පෙළ සිසුන් දැනුවත් කිරීම | 95 | 95 | 3250 | - නැත - |
| 09 | උසස් පෙළ සිසුන් දැනුවත් කිරීම | 57 | 57 | 2120 | - නැත - |
| 10 | ස්වයං රැකියා සඳහා පෙළඹවීම | 05 | 05 | 150 | 8750.00 |
| 11 | වෘත්තීය අභියෝග ජය ගැනීම | 04 | 04 | 120 | 28200.00 |
| 12 | බාහිර උපාධි අපේක්ෂකයින් සඳහා | 01 | 01 | 50 | 27550.00 |
| 13 | දිස්ත්‍රික් රැකියා පොළ | 01 | 01 | 625 | 25000.00 |
| 14 | පරිගණක පුහුණු | - නැත - | 10 | 1400 | - නැත - |



**2013.07.13 දින පැවති දිස්ත්‍රික් රැකියා පොළ**



**පරිගණක පුහුණු වැඩසටහනට අදාල සහතික පත්‍ර ප්‍රදානය**

## 5.1.6.3 ඵලදායිතා වැඩසටහන - 2013

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඵලදායිතාවය පවත්වා ගෙන යෑමටත් නව උත්පාදන යෝජනා ලබා ගැනීමේ අරමුණින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විවිධ අංශ සහ දෙපාර්තමේන්තු නියෝජනය වන පරිදි ඵලදායිතා කව පිහිටුවා ඇත. මෙම එක් එක් කවය මගින් 2013 වර්ෂයේ පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘති සකස් කර ක්‍රියාත්මක කර ඇත.

| | කවයේ නම | අංශය | නියැලී සිටි හා සිටින ව්‍යාපෘතීන් |
|---|---|---|---|
| 01 | ප්‍රගති | ආයතන | ලේඛනාගාරයේ ඇති සියලුම ආකෘති පත්‍ර සඳහා පරිගණක වැඩසටහනක් සැකසීම<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් ඉදිරිපත් කෙරෙන අතිකාල අයදුම්පත්‍ර අනුමැතිය සඳහා පරිගණක වැඩසටහනක් සැකසීම |
| 02 | මූල්‍ය ශක්ති | ගිණුම් | නියමිත දිනට පෙර සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අතිකාල අනුමැතිය ලබාදීමට හැකි පරිගණක වැඩසටහනක් සැකසීමේ ව්‍යාපෘතිය<br>වවුචර් සම්මත ආකාරයකට සකස්කිරීමේ ව්‍යාපෘතිය |
| 03 | මාතලී | මෝටර් රථ | රියදුරු බලපත්‍ර අයදුම්පත් අවලංගු වීම අවම කිරීමට හා අයදුම්පත් මුලසිට අවසානය දක්වා විහිදීයන ක්‍රමයක් මගින් නිවැරදි ආකාරයට ලෙජර ගත කිරීමේ ව්‍යාපෘතිය<br>රියදුරු පාසැල් සම්මතකරණය කිරීමේ ව්‍යාපෘතිය |
| 04 | ප්‍රතිභා | ක්‍රම සම්පාදන | මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම පැවැත්වීම මගින් ප්‍රගතිය නිවැරදිව හා නිසිදිනට ලබා ගැනීමේ ව්‍යාපෘතිය<br>දැනුම කළමනාකරණ ඒකකයක් මෙහෙයුම් මැදිරිය තුලම ස්ථාපිත කිරීම හා තොරතුරුවල පිටපත් මෘදු හා මුද්‍රිත මාධ්‍යයන් කඩිනමින් පාරිභොගිකයින් වෙත ලබාදියහැකි ක්‍රමවේදයක් සැකසීමමේ ව්‍යාපෘතිය |
| 05 | අපේක්ෂා | සමෘද්ධි | මහනුවර දිස්ත්‍රික්කයේ සමෘද්ධි අංශය තුළ සන්නිවේදන ජාලයක් සැකසීම.<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන සංවර්ධන නිලධාරින්ගේ පෞද්ගලික ලිපිගොනු වල පවතින අඩුපාඩු සොයාබැලීමේ ව්‍යාපෘතිය |
| 06 | ජනනී | සංඛ්‍යා ලේඛන | දත්තගොනුව පරිගණක වැඩසටහනකට ඇතුළත් කිරීමේ ව්‍යාපෘතිය |
| 07 | කම්සුරු | සංස්කෘතික, ජාතික ඒකාබද්ධතා, බෞද්ධ කටයුතු | මහනුවර දිස්ත්‍රික්කය තුළ පිහිටි රජමහා විහාරස්ථාන හා ඓතිහාසිකමය වශයෙන් වැදගත් පූජනීය ස්ථාන පිළිබඳ තොරතුරු ඇතුළත් ග්‍රන්ථයක් සැකසීම |
| 08 | SMART | කුඩා ව්‍යාපාර | තෝරාගත් ව්‍යාපාරිකයින් 15 දෙනෙකු සඳහා සංයුක්ත සැලැස්මක් සකස්කර ව්‍යාපාරය ඉදිරියට ගෙනයාම |
| 09 | ජීවන ප්‍රදීප | ළමා ආරක්ෂණ සමාජ ආරක්ෂණ | දිස්ත්‍රික් ළමා තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටු වීම |
| 10 | කළණ මිතුරු | ආපදා, ආපදා සහන සේවා | ආපදා කළමනාකරණ හා ආපදා සහනසේවා පරිගණක දත්ත පද්ධති මෘදුකාංගයක් සකස් කිරීම. |
| 11 | සහන | පාරිභෝගික සේවා | සුළු පරිමාණ කර්මාන්ත කරුවන්ගේ නිෂ්පාදන සම්බන්ධයෙන් අඩු ලුහුඬුකම් අවම කිරීමේ ව්‍යාපෘතිය<br>පාරිභෝගිකයින් සහ වෙළෙඳ ප්‍රජාව දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය |

| | | | |
|---|---|---|---|
| 12 | රන්පත කවය | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ | වසර අගවන විට සා.පෙළ ළමුන්ගේ හැඳුනුම්පත් ලබාගැනීමට ඇතිවන තදබදය අවම කිරීමේ ව්‍යාපෘතිය |
| 13 | ප්‍රමිති | කිරුම් මිනුම් හා ප්‍රමිති සේවා | මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අංශයේ භාවිතාවන තෘතියික ප්‍රමිති සඳහා විධිමත් ක්‍රමවේදයක් නොමැතිවීම. |
| 14 | තිනෙත් කවය | අභ්‍යන්තර විගණන ඒකකය | අභ්‍යන්තර විගණනය සඳහා අවශ්‍ය තොරතුරු හා විගණනවිමසුම් වලට පිළිතුරු ලබාගැනීම,ගොනුගත කිරීම හා ඉදිරි ක්‍රියාවලි සිදුකිරීම විධිමත් කිරීමේ ව්‍යාපෘතිය |
| 15 | විමසුම් කවය | විමර්ෂන මෙහෙයුම් ඒකකය | ඉවතලන ටයර් භාවිතාකර මල් පෝච්චි සැකසීම |
| 16 | අරුණළු කවය | සංවර්ධන | රජයේ රැකියා අපේක්ෂිත උපාධිධාරීන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සැකසීම |

එසේම ඵලදායිතා ඒකකය මඟින් මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරින්ගේ ඵලදායිතා සංකල්ප හා ඵලදායිතා මෙවලම් පිළිබඳව දැනුම මැන බැලීමේ අපේක්ෂාවෙන් සියළුම ඵලදායිතා කව අතර දැනුම මිනුම තරඟයක් සාර්ථක අන්දමින් පවත්වනු ලැබිය.






දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරින් සඳහා පවත්වනු ලැබූ දැනුම මිනුම තරඟය
2013/07/02 වන දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරය.

පසුගිය වසර තුළදී රාජ්‍ය හා පෞද්ගලික අංශයේද ප්‍රජාව හා පාසල් තුළද ඵලදායිතා වැඩසටහන් දියත් කරනු ලැබූ අතර ඒ පිළිබඳ තොරතුරු පහතින් දක්වා ඇත.

| අනු අංකය | වැඩසටහන | අංශය | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | | රාජ්‍ය | පෞද්ගලික | ප්‍රජා | පාසල් | වෙනත් | පෙර පාසල් | |
| 01 | 5 එස් සංකල්පය | 29 | 07 | 02 | 10 | 04 | 06 | 52 |
| 02 | තත්ත්ව කව | 04 | - | - | - | - | - | 04 |
| 03 | "කයිසෙන් ව්‍යවසායකයෝ "දැනුවත් කිරීමේ වැඩසටහන් | - | 02 | - | - | - | - | 02 |
| 04 | 5 එස් විගණන | 05 | - | - | - | - | - | 05 |
| 05 | ක්ෂේත්‍ර අධ්‍යයන | 02 | - | - | - | - | - | 02 |
| 06 | පොලිස් හමුදා මූලික නිරීක්ෂණ හා විගණන | 25<br>30 | | | | | | 55 |

# 6. ව්‍යවස්ථාපිත කටයුතු හා අනෙකුත් රාජකාරි

## 6.1 පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු ඒකකයේ කටයුතු

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ උප කාර්යාලයක් මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි පවත්වාගෙන යයි.1968 අංක 32 දරණ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත හා 1981 අංක 11 දරන සංශෝධනයට අනුව වයස අවු 16 සම්පූර්ණ කළ ශ්‍රී ලාංකික පුරවැසියන් කාර්යක්‍ෂමව හා සුරක්‍ෂිතව ලියාපදිංචි කර හැඳුනුම්පතක් නිකුත් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ අරමුණයි. ඒ අනුව මහනුවර දිස්ත්‍රික්කයේ පාසැල් ළමුන් සහ වතු අයදුම්කරුවන්ට හැඳුනුම්පත් නිකුත් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වේ.

ඒ අනුව මහනුවර දිස්ත්‍රික්කයේ පාසල් ළමුන් හා වතු අයදුම්කරුවන්ට හැඳුන්පත් නිකුත් කිරීම සම්බන්ධ කටයුතු මෙම මහනුවර ශාඛා කාර්යාලය මඟින් සිදුවේ. මහනුවර පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව ශාඛා කාර්යාලය මඟින් හැඳුනුම්පත් නිකුත් කිරීමක් සිදු නොකරත් ජාතික හැඳුනුම්පත් අයදුම්පත් නිකුත් කිරීම සහ එම අයදුම්පත් ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරීම සිදු කෙරේ.

**පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කටයුතු ප්‍රගතිය - 2013**

| | මාසය | ප්‍රගතිය (පු.ලි.දෙ/වි) | | | එකතුව |
|---|---|---|---|---|---|
| | | පුලිදෙ/වි 01 | පුලිදෙ/වි 07 | පුලිදෙ/වි 08 | |
| 01 | ජනවාරි | 3261 | 3000 | 2240 | 8501 |
| 02 | පෙබරවාරි | 4894 | 1050 | 500 | 6444 |
| 03 | මාර්තු | 10875 | 3390 | 5459 | 19724 |
| 04 | අප්‍රේල් | 3250 | 250 | 1000 | 4500 |
| 05 | මැයි | 5508 | 2250 | 1250 | 9008 |
| 06 | ජූනි | 1643 | 2250 | 1750 | 5643 |
| 07 | ජූලි | 2311 | 1000 | 2500 | 7811 |
| 08 | අගෝස්තු | 500 | - | 1000 | 1500 |
| 09 | සැප්තැම්බර් | 1066 | 1000 | 1000 | 3066 |
| 10 | ඔක්තෝබර් | 287 | 250 | 750 | 1287 |
| 11 | නොවැම්බර් | 2947 | 2750 | 3550 | 9247 |
| 12 | දෙසැම්බර් | - | - | - | - |
| | එකතුව | 36542 | 17190 | 20999 | 74731 |

**2013 වර්ෂයේ අනුමත කරන ලද අයදුම්පත්‍ර ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය**

| | මාසය | ප්‍රගතිය | | එකතුව |
|---|---|---|---|---|
| | | පාසැල් | වතු | |
| 01 | ජනවාරි | 107 | 03 | 110 |
| 02 | පෙබරවාරි | 203 | 04 | 207 |
| 03 | මාර්තු | 288 | - | 288 |
| 04 | අප්‍රේල් | 391 | 02 | 393 |
| 05 | මැයි | 1837 | - | 1837 |
| 06 | ජූනි | 2888 | - | 2888 |
| 07 | ජූලි | 2690 | 09 | 2699 |
| 08 | අගෝස්තු | 1452 | 02 | 1454 |
| 09 | සැප්තැම්බර් | 1336 | - | 1336 |
| 10 | ඔක්තෝබර් | 950 | 03 | 953 |
| 11 | නොවැම්බර් | 493 | - | 493 |
| 12 | දෙසැම්බර් | 116 | 08 | 122 |
| | එකතුව | 12749 | 31 | 12780 |

## 6.2 මෝටර් රථ ප්‍රවාහන කටයුතු

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවට අදාල කටයුතු දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුල මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාලයක් ස්ථාපිත කර ඇත.

මෝටර් රථ ප්‍රවාහන ආඥා පනත යටතේ පහත සඳහන් රාජකාරීන් මෙම කාර්යාලය මගින් සිදු කරනු ලැබේ.

01.නව රියදුරු බලපත්‍ර සඳහා අයදුම්පත් භාර ගැනීම.

02.ඒ සඳහා ලිඛිත පරීක්ෂණ පැවැත්වීම.

03.ලිඛිත පරීක්ෂණ සමත් අයදුම්කරුවන් සඳහා රියදුරු පුහුණු බලපත්‍රයක් ලබාදීම හා ප්‍රායෝගික පරීක්ෂණ සඳහා තුන්මසකට පසු එළැඹෙන දිනක දිනයක් ලබාදීම.

04. තෙමසකට පසු ප්‍රයෝගික පරීක්ෂණයකට යොමු කර ඉන් සමත්වන අයදුම්කරුවන් සඳහා තාවකාලික රියදුරු බලපත්‍රයක් නිකුත් කිරිම.

05. මැකී ගිය රියදුරු බලපත්‍ර වලට අදාල පරිසනක තොරතුරු ලබාදීම.

06. රියදුරු බලපත්‍රවල වලංගු කාලය දීර්ඝ කිරීම.

07. ලියාපදිංචි වාහනවලට අදාල අංක තහඩු නිකුත් කිරීම.

08. නව යතුරු පැදි ලියාපදිංචි කිරීම.

09. ලියාපදිංචි නොකළ වාහන පරීක්ෂා කිරිමෙන් අනතුරුව බර සහතික නිකුත් කිරීම.

10. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ අවසරය අනුව වාහන පරීක්ෂා කිරිමෙන් පසුව අනන්‍යතා සහතික නිකුත් කිරීම.

11. ලියාපදිංචි කළ වාහන සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ ලිඛිත අවසර මත වාහන පරීක්ෂා කර බර සහතික නිකුත් කිරීම.

12. මාර්ගයේ ධාවනය වන අබලි වාහන පරීක්ෂා කර ධාවනයට නුසුදුසු වාහන සඳහා තහනම් නියෝග හෝ අලුත්වැඩියාවෙන් පසු එම නියෝග ඉවත් කිරිම.

13. යෝග්‍යතා සහතික නිකුත් කිරීම සඳහා ගරාජ පරීක්ෂාව.

14. රජයේ රියදුරන් බඳවා ගැනීම, සේවා කාලය දීර්ඝ කිරීම , කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ වැනි අවස්ථාවල රියදුරන්ගේ රිය පැදවීමේ නිපුණත්වය පරීක්ෂා කිරීම.

15. රජයේ වාහන අළුත්වැඩියා කිරීම සඳහා නිර්දේශ ලබාදීම.

16. දිස්ත්‍රික්කයේ පිහිටි රියදුරු පාසැල් අධීක්ෂණය කිරීම හා පුහුණු වැඩමුළු පැවැත්වීම.

17. පොලිස් ස්ථාන මගින් අත් අඩංගුවට ගන්නා වෙනස් කල වාහන පරීක්ෂාව හා වාර්තා සැකසීම.

18. රිය අනතුරුවලට අදාල වාහන පරීක්ෂාව.

**2013 වසර තුලදී සිදු කරන ලද මෝටර් රථ ප්‍රවාහන කටයුතු ප්‍රගතිය**

| අනුඅංකය | කාර්යය | වාර්ෂික ඉලක්කය | ඉටුකල ප්‍රමාණය | මූල්‍ය ප්‍රගතිය රු. |
|---|---|---|---|---|
| 01 | රියදුරු පරීක්ෂණ ලිඛිත | 22175 | 15559 | 65,089,670.00 |
| 02 | රියදුරු පරීක්ෂණ ප්‍රායෝගික | 17750 | 29786 | -- |
| 03 | රියදුරු බලපත්‍ර අළුත් කිරීම | 15000 | 3543 | 4,143,700.00 |
| 04 | යතුරු පැදි ලියාපදිංචිය | 140 | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 05 | වාහන අංක තහඩු ලබාදීම | 11000 | 9434 | - |
| 06 | බර සහතික නිකුත් කිරීම | 550 | 1140 | 540,077.00 |
| 07 | අනන්‍යතා සහතික නිකුත් කිරීම | 525 | 192 | 76,875.00 |
| 08 | රජයේ වාහන පරික්ෂාව | 400 | 160 | - |
| 09 | තහනම් නියෝග | 400 | 193 | 26,500.00 |
| 10 | මාර්ග ආරක්ෂා කමිටු | 24 | 19 | - |
| 11 | හදිසි අනතුරු | | 1286 | - |
| | එකතුව | | | 69,876,822.00 |

## 6.3 පුපුරණ ද්‍රව්‍ය අංශයේ කටයුතු

2013 වසර තුලදී මෙම අංශය මගින් සිදු කරන ලද කටයුතු වල ප්‍රගතිය පහත වගු වලින් දක්වා ඇත.

**(අ) පුපුරණ ද්‍රව්‍ය නිකුත් කිරීම**

ව්‍යවස්ථාපිත/නෛතික

1956 අංක 21 දරන පුපුරණ ද්‍රව්‍ය පනත

1979 පුපුරණ ද්‍රව්‍ය නියෝග

අංක CS/7/EX/1/38 හා 2010.08.25 දිනැති පුපුරණ ද්‍රව්‍ය චක්‍රලේඛය

| කාර්යයන් | ප්‍රගතිය | |
|---|---|---|
| | භෞතික | මූල්‍ය රු. |
| 1. පුපුරණ ද්‍රව්‍ය අවසර පත්‍ර නිකුත් කිරීම | 345 | 78,800.00 |
| 2. පුපුරණ ද්‍රව්‍ය නිෂ්පාදන බලපත්‍ර නිකුත් කිරීම | 06 | 3,250.00 |
| 3. පුපුරණ ද්‍රව්‍ය සපයන්නාගේ බලපත්‍ර නිකුත් කිරීම | 13 | 21,500.00 |
| 4. පුපුරණ ද්‍රව්‍ය ආනයන බලපත්‍ර නිකුත් කිරීම | 01 | 5,000.00 |
| 5. ගිනිකෙළි භාණ්ඩ නිෂ්පාදන බලපත්‍ර නිකුත් කිරීම | 05 | 22,500.00 |
| 6. ගිනිකෙළි භාණ්ඩ සපයන්නාගේ බලපත්‍ර නිකුත් කිරීම | 369 | 126,500.00 |
| එකතුව | | 237,300.00 |

**(ආ) තුවක්කු**

| කාර්යයන් | ප්‍රගතිය | |
|---|---|---|
| | භෞතික | මූල්‍ය රු. |
| ගිනි අවි බලපත්‍ර වාර්ෂිකව අලුත් කිරීම | 785 | 155,900.00 |
| මුරකරු බලපත්‍ර නිකුත් කිරීම | 136 | 1,360.00 |
| නැතිවීමේ සහතිකය නිකුත් කිරීම | 05 | 50.00 |
| 4. නව ගිනි අවි බලපත්‍ර අයදුම් පත් නිකුත් කිරීම | 126 | 1,260.00 |
| 5. නව ගිනි අවි බලපත්‍ර අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීම | 26 | - |
| තක්සේරු කරන ලද ගිනි අවි විකිණීම | 19 | 134,500.00 |
| එකතුව | | 292,870.00 |

**(ඇ) පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන**

| කාර්යයන් | ප්‍රගතිය | |
|---|---|---|
| | භෞතික | මූල්‍ය රු. |
| 1.පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන ලියාපදිංචි කිරීම | 14 | 14,000.00 |

## 6.4 පාරිභෝගික සේවා අධිකාරියේ කටයුතු

2003 අංක 04 දරණ පාරිභෝගික කටයුතු අධිකාරි පනතට අනුව අසාධරණ වෙළඳ පිළිවෙත් වලට විරුද්ධව පාරිභෝගිකයන් ආරක්‍ෂා කිරීම හා පාරිභෝගික අයිතිවාසිකම් වලට නිසි සැලකිල්ල දැක්වීම මෙම ඒකකයේ අරමුණ වේ.

වෙළඳ අක්‍රමිකතා වලට එරෙහිව වැටලීම් සිදු කිරීම හා අදාල අධිකරණ වල නඩු පැවරීම, පාරිභෝගික සමිති හා වෙළඳ ප්‍රජාව සංවිධාන කිරීම වැනි කාර්යයන් මෙම ඒකකය මඟින් සිදු කරනු ලබන අතර මේ සඳහා දිස්ත්‍රික් ප්‍රධානියෙකු, විමර්ෂණ නිලධාරින් 12 දෙනෙකු හා සංවර්ධන නිලධාරියෙකු අනුයුක්තව රාජකාරි කටයුතු සිදු කෙරේ.

**පාරිභෝගික සේවා කටයුතු ප්‍රගතිය - 2013**

1. වෙළඳපළ වැටලීම්

| වැටලීම් | නඩු පැවරීම් | අභියාචනා | ඉදිරි මාස සඳහා ඇති නඩු | දඩ මුදල් (රු.) |
|---|---|---|---|---|
| 2736 | 2172 | 220 | 344 | 8,829,300.00 |

2. පාරිභෝගික අධ්‍යාපනය හා සවිබල ගැන්වීම්

| කාර්යය | ප්‍රමාණය |
|---|---|
| i. පාරිභෝගික සංවිධාන පිහිටුවීම | 01 |
| ii. පාරිභෝගික අධ්‍යාපන වැඩසටහන් (පාසැල්/පාරිභෝගික) | 16 |
| iii. වෙළඳුන් දැනුවත් කිරීම් | 20 |
| iv. මාධ්‍ය තුළින් දැනුවත් කිරීම් | 45 |

3. **(i)** පාරිභෝගික සහන සහ පැමිණිලි (ලිඛිත)

| කාර්යය | කාර්යය |
|---|---|
| i. දිස්ත්‍රික් කාර්යාලයට ලැබුණු නව පැමිණිලි | 117 |
| ii. ප්‍රධාන කාර්යාලය මඟින් යොමු කරන ලද පැමිණිලි | 12 |
| iii. සහන ලබා දී අවසන් කරන ලද පැමිණිලි | 116 |
| iv. නීති අංශයට යොමු කරන ලද පැමිණිලි | 13 |

**(ii)** දුරකථනය මඟින් සහ වාචිකව ලැබුණු පැමිණිලි - 192

## 6.5 මිනුම් ඒකක ප්‍රමිති හා සේවා කටයුතු

මෙම ඒකකය මගින් සිදු කරනු ලබන කාර්යභාරය ඇතුලත් සටහනක් පහතින් දක්වා ඇත.




**මිනුම් ඒකක ප්‍රමිති හා සේවා ප්‍රගතිය -2013**

| අනු අංකය | විස්තරය | සපුරාගත් ඉලක්ක | |
|---|---|---|---|
| | | ඒකක එකතුව | රුපියල් |
| 01 | දිස්ත්‍රික්කය පුරා වෙළඳ ප්‍රජාවගේ කිරුම් උපකරණ සත්‍යාක්ෂණය කොට මුද්‍රා තැබීමෙන් රජයට ආදායම් ලබා ගැනීම | 96903 | 10,756,796.42 |
| 02 | දිස්ත්‍රික්කය පුරා වැටලීම් සංවිධානය කර වැරදි කිරුම් මිනුම් උපකරණ අත් අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීම මගින් දඩ අදායම් ලබා ගැනීම. | 149 | 457,000.00 |

## 6.6 පරිසර කටයුතු 2013

ශ්‍රී ලංකාවේ වර්තමාන සහ අනාගත පරපුරේ අපේක්ෂාවන් සපුරාලන ඵලදායි සහ පිවිතුරු පරිසරයක් ඇති කරලීමේ දැක්ම අරමුණු කරගනිමින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි ප්‍රාදේශීය පරිසර නිලධාරින් අනුයුක්ත කර ඇති අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත පරිසර නිලධාරි එම කටයුතු සම්බන්ධීකරණය කරනු ලබයි.

දිස්ත්‍රික් පාරිසරික නීති ක්‍රියාත්මක කිරීමේ කමිටුව කැඳවීම හා එයට අදාළ කටයුතු ඉටු කිරීම හා සංරක්ෂිත ප්‍රදේශ කළමනාකරණය යටතේ හන්තාන කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම මෙහිදී ක්‍රියාත්මක වන ප්‍රධාන ක්ෂේත්‍රයන් වේ. පසුගිය වර්ෂයේදී දිස්ත්‍රික් පාරිසරික නීති ක්‍රියාත්මක කිරීමේ කමිටු රැස්වීම් 5ක් පවත්වා ඇති අතර හන්තාන කළමනාකරණ කමිටුව 8 වතාවක් රැස්වී ඇත. පාරිසරික වශයෙන් සංවේදී කලාපයක් වන හන්තාන ප්‍රදේශය ආරක්ෂා කිරීම සඳහා මෙම කළමනාකරණ කමිටුව කේන්ද්‍ර කර ගනිමින් විශේෂිත වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. විශේෂයෙන්ම මේ යටතේ වර්තමාන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි මෙම ප්‍රදේශයේ සීමාවන් නැවත සළකුණු කිරීම සඳහා සියළුම ක්ෂේත්‍රවල නිලධාරින් එක්ව ඒකාබද්ධ වාර්තාවක් සකස් කිරීම 2013 වර්ෂයේදී කටයුතු කරනු ලැබිණි.

මහනුවර ඓතිහාසික ශ්‍රී දළදා මාළිගාවේ වාර්ෂික පෙරහැර මංගල්‍යය වෙනුවෙන් පැමිණෙන ලක්ෂ සංඛ්‍යාත දෙස් විදෙස් ජනතාව පරිසර කටයුතු සම්බන්ධයෙන් දැනුවත් කිරීම සහ මහනුවර නගරයේ පරිසරය ආරක්ෂා කරගැනිම සඳහා පාරිසරික සත්කාරය නමින් විශේෂිත වැඩසටහනක් 2013 වර්ෂයේදී ද ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පහත සටහනේ දක්වා ඇත.

| අනු අංකය | වැඩසටහන / ව්‍යාපෘතිය | සංඛ්‍යාව | ස්ථානය |
|---|---|---|---|
| 1. | ජගත් පරිසර දිනය සැමරීම | 01 | මහනුවර විද්‍යාර්ථ විද්‍යාලය |
| 2. | දැයට සෙවණ ජාතික රුක් රෝපණ වැඩසටහන | 01 | පල්ලේකැලේ රයිෆල් බලකා මූලස්ථානය |
| 3. | දිස්ත්‍රික් පාරිසරික නීති ක්‍රියාත්මක කිරීමේ කමිටුව | 05 | දි.ලේ.කා.මහනුවර |
| 4. | හන්තාන කළමණාකරණ කමිටුව | 08 | දි.ලේ.කා.මහනුවර |

## 6. 7 සංඛ්‍යා ලේඛන කටයුතු - 2013

ශ්‍රී ලංකාවේ ජීවත්වන ජනතාවගේ යහපත් අනාගතය උදෙසා සකස් කරන සැලසුම් සඳහා අවශ්‍ය විවිධ ක්ෂේත්‍ර වලට අදාල යාවත්කාලීන කරන ලද තොරතුරු ඇතුලත් සංඛ්‍යාලේඛණ එක්රැස් කිරීම, විග්‍රහ කිරීම හා විශ්ලේෂණය කිරීම සඳහා ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව යටතේ වන දිස්ත්‍රික් කාර්යාලය මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුබද්ධව ස්ථාපිත කර ඇත.

ජාතික සැලසුම්කරණයට සහ රජයේ ප්‍රතිපත්ති සකස් කිරීම මෙන්ම එම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඇගයීම සඳහා අවශ්‍ය දත්ත සැපයීම මෙම දෙපාර්තමේන්තුව මඟින් නොකඩවා සිදු කළ යුතු අතර වර්ෂ 10 ට වරක් ජන හා නිවාස සංගණනය පැවැත්විය යුතු වේ.එම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා 2013 වර්ෂය තුල පහත සඳහන් වැඩසටහන් හා සමීක්ෂණ සිදුකරන ලදී.

| අනු අංකය | වැඩසටහන | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|---|
| 1 | ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය | නිවාස ඒකක 2160 | නිවාස ඒකක 2160 |
| 2 | ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය - සමීක්ෂණය පැවැත්වීම | නිවාස ඒකක 1200 | නිවාස ඒකක 1200 |
| 3 | ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය | නිවාස ඒකක 1200 | නිවාස ඒකක 1200 |
| 4 | මිල රැස්කිරීම | | |
| | කාණ්ඩ 1 ඒ (විවෘත වෙළඳපොල සිල්ලර මිල රැස්කිරීම - සතිපතා) | වාර 52 | වාර 52 |
| | කාණ්ඩ 1 (විවෘත වෙළඳපොල මිල සිල්ලර රැස්කිරීම - මසකට දෙවරක්) | වාර 24 | වාර 24 |
| | කාණ්ඩ 1 ඒ (විවෘත වෙළඳපොල සිල්ලර මිල රැස්කිරීම - මසකට වරක්) | වාර 12 | වාර 12 |
| | කාණ්ඩ 1 ඒ (විවෘත වෙළඳපොල සිල්ලර මිල රැස්කිරීම - කාර්තුවකට වරක්) | වාර 4 | වාර 4 |
| | නිෂ්පාදකයාගේ මිල | ප්‍රා.ලේ.කොට්ඨාස 20 | ප්‍රා.ලේ.කොට්ඨාස 20 |
| 5 | වී අස්වනු සමීක්ෂණය | ප්‍රා.ලේ.කොට්ඨාස 20 | ප්‍රා.ලේ.කොට්ඨාස 20 |

| | | | |
|---|---|---|---|
| **6** | වී /ගොඩ භෝග පිළිබඳ සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම ( පී 11 / එච් 11 වාර්තා ) | ප්‍රා.ලේ.කොට්ඨාස 20 | ප්‍රා.ලේ.කොට්ඨාස 20 |
| **7** | ගව කුකුළු ආදි සතුන් පිළිබඳ සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම (එල් 11 වාර්තා) | ප්‍රා.ලේ.කොට්ඨාස 20 | ප්‍රා.ලේ.කොට්ඨාස 20 |
| **8** | පොල් නිෂ්පාදන වියදම් පිළිබඳ සමීක්ෂණය | ප්‍රා.ලේ.කොට්ඨාස 20 | ප්‍රා.ලේ.කොට්ඨාස 20 |
| **9** | මස් පිණිස මරනු ලබන සතුන් පිළිබඳ සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම | ප්‍රා.ස. 17, ම.න.ස. 1, න.ස. 4 | ප්‍රා.ස. 17, ම.න.ස. 1, න.ස. 4 |
| **10** | ගොඩනැගිලි සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම | ප්‍රා.ස. 17, ම.න.ස. 1, න.ස. 4 | ප්‍රා.ස. 17, ම.න.ස. 1, න.ස. 4 |
| **11** | පළාත් පාලන සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම | ප්‍රා.ස. 17, ම.න.ස. 1, න.ස. 4 | ප්‍රා.ස. 17, ම.න.ස. 1, න.ස. 4 |
| **12** | ත්‍රෛමාසික කාර්මික නිෂ්පාදන පිළිබඳ සමීක්ෂණය | ප්‍රා.ලේ.කොට්ඨාස 20 | ප්‍රා.ලේ.කොට්ඨාස 20 |
| **13** | වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය | ප්‍රා.ලේ.කොට්ඨාස 20 | ප්‍රා.ලේ.කොට්ඨාස 20 |
| **14** | ආර්ථික සංගණනය-කර්මාන්ත, වෙළඳ හා සේවා ලැයිස්තුගත කිරීම | ප්‍රා.ලේ.කොට්ඨාස 20 | ප්‍රා.ලේ.කොට්ඨාස 20 |
| **15** | ගැටුම් හේතුවෙන් මියගිය/තුවාල ලැබූ පුද්ගලයන් හා දේපල හානි පිළිබඳ සංගණනය - 2013 | ප්‍රා.ලේ.කොට්ඨාස 20 | ප්‍රා.ලේ.කොට්ඨාස 20 |

## 7. සමාජ සේවා හා සංස්කෘතික කටයුතු

### 7.1 සංස්කෘතික කටයුතු - 2013

| අනු අංකය | වැඩසටහන/ව්‍යාපෘතිය/ක්‍රියාකාරකම | ස්ථානය | ප්‍රතිලාභීන් ගණන | වැය කල මුදල රු: |
|---|---|---|---|---|
| 1 | ආගමානුකූල චාරිත්‍රවලට මුල්තැන දෙමින් නව වසරේ කාර්යාල කටයුතු ඇරඹීම. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | | |
| 2 | නව වසරට දිස්ත්‍රික් ලේකම්ට ලැබෙන සුබ පැතුම් සඳහා හා දි.ලේ.කා සමග සම්බන්ධතා පවත්වන ආයතන වෙත සුභ පැතුම් පත් යොමු කිරීමේ කටයුතු | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 500 | 10,000 |
| **3** | 65 වන ජාතික නිදහස් දින උත්සවය අභිමානවත්ව සැමරීම.  | බෝගම්බර ක්‍රීඩාංගණය | 3000 | 275,000 |
| **4** | ගර්භනී මාතාවන් සහභාගි කර ගනිමින් රසවින්දනාත්මක වැඩසටහනක් පැවැත්වීම. | තලාතුඔය පින්නගොල්ල ශ්‍රී සද්ධර්මාරාමය | 150 | 90,000 |
| 5 | අවුරුදු උත්සවය සංවිධානය කර පැවැත්වීම. | මහනුවර සිල්වෙස්ටර් ක්‍රීඩාංගණය | 300 | 35,000 |

| | | | | |
|---|---|---|---|---|
| 6 | 2013.06.29 වාරියපොළ ශ්‍රී සුමංගල විද්‍යාලයේ රාජ්‍ය ළමා චිත්‍ර තරගාවලියේ දිස්ත්‍රික් තරග පැවැත්වීම සහ ජයග්‍රහණ චිත්‍ර ජාතික මට්ටමට යොමු කිරීම. | වාරියපොළ ශ්‍රී සුමංගල විද්‍යාලය | 150 | |
| 7 | කලා රසවින්දන වැඩසටහනක් පැවැත්වීම. | ධර්මරාජ විද්‍යාලය | 500 | 75,000 |
| 8 | දේශීය ආහාර ප්‍රවර්ධන සංස්කෘතික වැඩසටහන පැවැත්වීම. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ගඟවට ප්‍රා.ලේ කාර්යාලය ඒකාබද්ධව | 250 | 20,000 |
| 9 | මහනුවර දිස්ත්‍රික් අන්තර් කලායතන නර්තන තරග පැවැත්වීම | මහනුවර අස්ගිරිය වන්දානන්ද බෞද්ධ විද්‍යාලය | 1000 | 40,000 |
| 10 | කලායතනාධිපති වැඩමුළුව | ඊ.එල් සේනානායක ළමා පුස්තකාල ශ්‍රවණාගාරය | 300 | 76,500 |
| 11 | සාහිත්‍ය කලා මහෝත්සවය | උඩරට කලා සංගම් ශාලාව | | 105,000 |

## 7.2 බෞද්ධ කටයුතු - 2013

| අනු අංකය | වැඩසටහන/ව්‍යාපෘතිය/ක්‍රියාකාරකම | ස්ථානය | සංඛ්‍යාව | වැයකළ මුදල රු. |
|---|---|---|---|---|
| **1** | දසසිල් මෑණිවරුන් 600 නමක් අරලිය ගහ මන්දිරයට වැඩම කරවීම | කොළඹ අරලියගහ මන්දිරය | 40 | 19000.00 |
| **2** | මධ්‍යම පළාත් බෞද්ධ කටයුතු සමායෝජක සංවර්ධන නිලධාරින්/සංවර්ධන සහකාර නිලධාරින් සඳහා පුහුණුව | කටුගස්තොට රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 66 | 54720.00 |
| **3** | ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහානායක පදවි උත්සවය | හුරිකඩුව පිරිවෙන | | |
| **4** | පාළි භාෂා ප්‍රවර්ධන පාඨමාලාවේ ආරම්භක කටයුතු ඉටු කිරීම | ශ්‍රී රාජසිංහ පොත්ගුල් විහාරය | 65 | 60000.00 |
| **5** | ස්‍යාමෝපසම්පදාවට වසර 260ක් පිරීම නිමිත්තෙන් මහා සංඝරත්නය 260 නමකගේ සහභාගිත්වයෙන් පිණ්ඩපාත චාරිකාව | මහනුවර | | |
| **6** | සමස්ත ලංකා භක්ති ගීත තරඟාවලියෙන් ජයග්‍රහණය ලැබූ කණ්ඩායම් අම්පාර දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට | අම්පාර | | 60000.00 |
| **7** | අවුරුදු උත්සවය සංවිධානය කර පැවැත්වීම. | මහනුවර සිල්වෙස්ටර් ක්‍රීඩාංගණය | 300 | |
| **8** | ස්‍යාමෝපාලි මහා නිකාය සැමරීම සඳහා සිසු රචනා නිපුණතා දිස්ත්‍රික් වැඩසටහන | මහනුවර අස්ගිරි මහා පිරිවෙන | 45 | 1500.00 |
| **9** | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ශ්‍රී දළදා මාළිගාවේ මාධ්‍ය ඒකකය එක්ව සංවිධානය කරන ලද වෙසක් පහන් කූඩු නිර්මාණ ඇගයීමේ වැඩසටහන | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | | |
| **10** | දහම් සරසවිය ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හා පාඨමාලාව පැවැත්වීම. | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 196 | **8**5,000.00 |
| **11** | අනුරාධපුරයේ ඉදිවෙන සඳහිරු සෑයේ නිදන් වස්තු තැන්පත් කිරීම | අනුරාධපුරය | | |

| | | | | |
|---|---|---|---|---|
| **12** | ඇසළ මහා පෙරහැර මංගල්‍යය සංවිධාන කටයුතු | මහනුවර | | |
| **13** | ස්‍යාමෝපාලි මහා නිකාය සැමරීමේ සමස්ත ලංකා සිසු රචනා නිපුණතා ඇගයීම | පොල්ගොල්ල සමුපකාර පුහුණු ආයතනය | 60 | 125000.00 |
| **14** | මහනුවර ශ්‍රී මහාවිෂ්ණුදේවාලයට බස්නායක නිළමේවරයෙකු තෝරා පත්කර ගැනීමේ සංවිධාන කටයුතු. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | | |
| **15** | සමස්ත ලංකා දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම් වැඩසටහනට සහභාගි වන මහනුවර දිස්ත්‍රික්කයේ සිසුන් සඳහා දැනුවත් කිරීම | මහනුවර ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රැස්වීම් ශාලාව | 40 | |
| **16** | දිස්ත්‍රික් දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම් වැඩසටහන | ශ්‍රී චන්ද්‍රානන්ද බෞද්ධ විද්‍යාලය මහනුවර | | |
| **17** | අතිගරු ජනාධිපතිතුමාට සෙත්පතා විශේෂ ආගමික වැඩසටහනක් පැවැත්වීම | ආණ්ඩුකාර කාර්යාලය මහනුවර | | |
| **18** | පාළි විභාගය සංවිධානය කර පැවැත්වීම | ශ්‍රී රාජසිංහ පොත්ගුල් මහා විහාරය | 40 | 1620.00 |

## 7.3 සමාජ සේවා කටයුතු - 2013

මහනුවර දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සමාජ සේවා හා සමාජ සුබසාධන විෂය ක්ෂේත්‍රයට ගැනෙන සියළුම වැඩසටහන් සැලසුම් කිරීම, සංවිධානය කිරීම හා සම්බන්ධීකරණය කිරීමේ කටයුතු, ස්වේච්ඡා සංවිධාන ආශ්‍රිත කටයුතු සහ ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන් හා ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලයේ කටයුතු අධීක්ෂණය කිරීම මේ යටතේ සිදුකරනු ලබන ප්‍රධාන කාර්යයන් අතර වේ.

**පසුගිය වසර තුලදී සිදු කරන ලද සමාජ සේවා කටයුතු ප්‍රගතිය**

**ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන**

| අනු අංකය | විස්තරය | ක්‍රියාත්මක ප්‍රා.ලේ. කොට්ඨාස සංඛ්‍යාව | ප්‍රතිලාභී සංඛ්‍යාව | මුදල රු. |
|---|---|---|---|---|
| 01 | වැඩිහිටි දීමනා ගෙවීම | 20 | 13458 | 1,345,800.00 |
| 02 | තනි මාපිය පවුල් සංවර්ධන යටතේ ස්වයං රැකියා අධාර ලබා දීම (රු.10,000/=) | 4 | 8 | 80,000.00 |
| 03 | ආබාධිත වූවන් සඳහා ජීවනාධාර ගෙවීම | 20 | 680 | 24,480,000.00 |
| 04 | නිවාස අධාර ලබා දීම | 4 | 11 | 2,750,000.00 |
| 05 | ආබාධිත පුද්ගලයන් සඳහා ස්වයං රැකියා ලබා දීම රු.(25,000) | 8 | 24 | 600,000.00 |
| 06 | වැඩිහිටි කමිටු පිහිටුවීම - | | | |
| | මධ්‍යම පළාතේ ග්‍රාමීය කමිටු | | 1 | |
| | ප්‍රාදේශීය බල මණ්ඩල | | 1 | |
| | දිවා සුරැකුම් මධ්‍යස්ථාන | | 5 | |
| | දිස්ත්‍රික් බල මණ්ඩල | | 1 | |
| | පළාත් බල මණ්ඩල | | | |

ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව | ප්‍රා.ලේ. කොට්ඨාස ගණන | වියදම රු. |
|---|---|---|---|---|
| 01 | ස්වශක්ති කණ්ඩායම් හා දෙමාපිය කණ්ඩායම් සවිබල ගැන්වීම් | 128 | 20 | 600,000.00 |
| 02 | නිවෙස් මට්ටමේ පුනරුත්ථාපනය | 509 | 20 | |
| 03 | පෙර පාසැල් ගත කිරීම | 62 | 19 | |
| 04 | සාමාන්‍ය පාසැල් ගත කිරීම | 26 | 8 | |
